brandix
inspired solutions

# වියමන්

## ප්‍රබෝධය අපියි

බ්‍රැන්ඩික්ස් ලංකා ප්‍රකාශනයකි | 2017 ජූලි ● 66 වැනි කලාපය



රැළි අතරේ පෙණ විසිරේ සයුරු තෙරේ  මද පවනේ
සැම මුවගේ සිනහ නැගේ මිතුරු දමේ  රජ දහනේ

Like us on
facebook.com/viyaman

නිරූපණය: බ්‍රැන්ඩික්ස් ඇපරල් සොලුයුෂන්ස් - ෆිනිෂින් රත්මලාන ආයතනයේ සොයුරු සොයුරියන්

# කිත් යසස් නංවන බ්‍රැන්ඩික්ස් පරපුර



සම්මානයකින් පිදුම් ලැබීම බ්‍රැන්ඩික්ස් අපට අරුමයක් නෙවෙයි. එයට හේතුව වන්නේ අපි විවිධාකාරයේ ක්ෂේත්‍රයන්හිදී විවිධ සම්මානයන්ට පාත්‍රවීමයි. විටෙක නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් සම්මානයට පාත්‍රවන අපි තවත් විටෙක තිරසාරකත්වය, මානව සම්පත් කළමනාකරණය, සමාජ සත්කාරක සේවාවන් ආදිය සම්බන්ධයෙන් සම්මානයන්ට බඳුන් වෙනවා. තවත් විටෙක පාරිසරික වැඩසටහන් සම්බන්ධයෙන් සම්මානයන්ගෙන් පිදුම් ලබනවා. ආයතන සමූහයක් ලෙසින් අපි එලෙස සම්මානයන්ට පාත්‍රවුණත් ඒ සියලු සම්මානයන්ගේ මෙන්ම ගෞරවයන්ගේ හිමිකරුවන් වන්නේ හතලිස් අට දහසක් පමණ වූ සාමාජික ඔබ සියලුදෙනා බව අපි සෑමවිටෙකම පුන පුනා සඳහන් කරන්නක්. අප පිදුම් ලැබූ ගරු බුහුමන් අතරට පසුගියදා තවත් සුවිශේෂී සම්මානයන් ද්විත්වයක් මෙන්ම මෙරට වටිනාම අපනයන වෙළඳ නාමය ලෙසින් ශ්‍රේණිගත කිරීමට ලක්වීමත් එක්වුණා.




### ශ්‍රී ලංකාවේ වටිනාම අපනයන වෙළඳ නාමය ලෙස අඛණ්ඩව තුන්වන වරටත් බ්‍රැන්ඩික්ස් නම් කෙරේ

මෙරටට විදේශ විනිමය උපයාදෙන ප්‍රධානම මාර්ගයක් වන්නේ ඔබේ අතින් නිමවෙන ඇඟලුමයි. ඒ ලෙසින් බලද්දී දේශීය ආර්ථිකය සවිබලගැන්වීම සඳහා ජාතික ආදායමට රන් කහවනු එක්කරන්න සෘජුවම දායක වන පිරිසක් බවට අපි පත්වෙලා. ඒවගේම මෙරට ආර්ථිකයට විදේශ විනිමයක් උපයා දෙන ප්‍රධානතම තනි අපනයනකරු වන්නේ බ්‍රැන්ඩික්ස් නාමයයි. ඒ නිසාම තමයි අපි අඛණ්ඩව වසර දෙකක්ම අපනයන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේදී පිරිනමනු ලබන ඉහළම සම්මාන වන ජනාධිපති සම්මානයන්ගෙන් පවා පිදුම් ලැබුවේ.

බ්‍රැන්ඩික්ස් නාමය මෙරට අපනයන ක්ෂේත්‍රයේදී හැමදාමත් ඉහළින්ම පවතින්නක් බවට ඉහත කරුණු කාරනා සාක්ෂි දරාවි. එය තවදුරටත් තහවුරු කරමින් පසුගියදා ශ්‍රී ලංකාවේ වටිනාම අපනයන වෙළඳ නාමය ලෙසින් ශ්‍රේණිගත වන්නට අපට හැකි වුණා. ඒ 2017 වසර සඳහා නිවේදනය කරන ලද Brand Finance ශ්‍රේණිගත කිරීමේදියි. එහි වන සුවිශේෂීත්වය වන්නේ අප එලෙසින් ශ්‍රේණිගත වුණේ අඛණ්ඩව තුන්වන වරට වීමයි. මෙලෙසින් ශ්‍රේණිගත කිරීමට මූලික වුණු නිර්ණායකයන්ව තිබුණේ, අපගේ දැක්ම, කීර්තී නාමය සහ ප්‍රතිරූපය, නායකත්වය සහ මානව සම්පත මෙන්ම නවොත්පාදනයන් ආදියයි. මෙලෙසින් ප්‍රමුඛයන් අතර ප්‍රථමයාවීමට ලැබීම බ්‍රැන්ඩික්ස් පවුලේ අප කාටත් අභිමානයට කරුණක්.

## ගෝලීය සැපයුම්කරුවන් වෙතින් බ්‍රැන්ඩික්ස් නැවතත් සම්මානයට



### Gap Inc. හි වසරේ හොඳම සැපයුම්කරු

ලොව ප්‍රමුඛ පෙළේ ඇඟලුම් සන්නාමයන් බොහෝමයකට ජීවය කැවෙන්නේ අපගේ කර්මාන්තශාලා පරිශ්‍රයන්හිදී, ඔබගේම දෑතින් බව අපි කවුරුත් හොඳින් දන්නවා. Gap Inc. කියන්නේ එලෙසින් අපේ අතින් නිමවෙන ලොව පිළිගත් එක් ඇඟලුම් සන්නාමයක්. Gap Inc. ආයතනය විසින් ප්‍රදානය කරන වසරේ හොඳම සැපයුම්කරු සම්මානය දිනාගැනීමට මේ වසරේදී බ්‍රැන්ඩික්ස් අපි සමත් වුණා. මීට ප්‍රථමයෙනුත් අපි ඔවුන් වෙතින් විශිෂ්ටතම සැපයුම්කරු සම්මානයෙන් පිදුම් ලබා තියෙන බව ඔබට මතක ඇති. එපමණක් නෙවෙයි අප Gap Inc. වෙතින් නවෝත්පාදනය උදෙසාද මීට පෙර සම්මාන දිනාගෙන තිබෙනවා. එලෙසින් ලෝකය ඉදිරියේ ශ්‍රී ලාංකේය නාමය දිදුළවීමට හැකිවීම අපි හැමෝගේම මහන්සියේ ප්‍රතිඵලයක් ලෙසින් හඳුන්වන්න පුළුවන්.

### PVH වෙතින් අපගේ විශිෂ්ට කාර්යය සාධනය ඇගයේ

PVH කියන්නේ ලොව සුවිසල් ඇඟලුම් සන්නාමයක්. එය එසේ හැඳින්වීමට හේතුව වන්නේ Calvin Klein, Tommy Hilfiger ආදීවූ ලොව සුපතල ඇඟලුම් සන්නාමයන් එම ආයතනයට අයත් වන නිසයි. අප සමූහයට අයත් කර්මාන්තශාලාවල නිමැවෙන මෙම සන්නාමයන්ගේ ඇඟලුම් සැපයෙන්නේ PVH ආයතනයටයි. එම සමාගම විසින් වසර දෙකකට වරක් පවත්වන ගෝලීය සම්මාන ප්‍රදානයේදී 2016 වසර සඳහා තිරසාර සම්මානය දිනාගැනීමට සමත් වුණේ අප ආයතන සමූහයයි. එය ප්‍රදානය කරනු ලැබූවේ සමාජ වගකීම් සහ තිරසාරකත්වය කරා අප විසින් දක්වන ලද විශිෂ්ට කාර්යය සාධනය ඇගයීමට ලක් කරමිනුයි. කවදත් සමාජ වගකීම්වලදී ඉදිරියෙන්ම සිටින බ්‍රැන්ඩික්ස් අපගේ එකී දායකත්වය ඇගයීමට ලක්කිරීමෙන් අපගේ ඉදිරි ගමන සාර්ථක කරගැනීමට ලැබුණු සොඳුරු තල්ලුවක් ලෙසින් හැඳින්විය හැකියි.

විශිෂ්ටයෙක් බවට පත්වීම අපහසුයි. නමුත් වඩා අපහසු වන්නේ ඒ විශිෂ්ටත්වය රැක ගැනීමයි. බ්‍රැන්ඩික්ස් අපගේ වන සුවිශේෂීත්වය වන්නේ ඒ විශිෂ්ටත්වය තව තවත් වර්ධනය කරමින් රැකගෙන ඒමයි. එය තනි පුද්ගලයෙකුට හෝ සුළු පිරිසකට කළ හැකි යමක් නෙවෙයි. අපගේ ඒ සාර්ථක ගමනේ මූලික හේතුව වන්නේ සාමාජිකයින් වන ඔබ සියලු දෙනායි. පුරුක පුරුක එක්වී සවිමත් දම්වැලක් සැදෙන සේම අප සියලුදෙනාගේ එකතුවෙන් තව තවත් දෙස් විදෙස් ගුවන් තලයෙහි බ්‍රැන්ඩික්ස් නාමය රැව් පිළිරැව් දීමට අපට හැකි වේවි. ඉතින් මේ බැඳගත් අත්වැල තව තවත් ශක්තිමත් කරමින් එන්න අපි ඇවිද යමු සාර්ථකත්වයේ මාවතේ.

# ඔබට සවන්දීමට මම සූදානම්



පේශලී ප්‍රනාන්දු - සමූහ මනෝ සංවර්ධන උපදේශිකා

**අද අපේ සමාජයේ බොහෝ දෙනා තමන්ගේ මානසිකත්වයේ සැබෑ ස්වරූපය විවෘත කරන්න මදක් පැකිලෙනවා. ඒ නිසාම බාහිර උපදේශනයක් මගින් තමන්ගේ මානසිකත්වයේ අඩුපාඩු හඳාගෙන තවත් ශක්තිමත් වෙන්න තියෙන අවස්ථාව ඒ අයට මගහැරෙනවා.**

ඉතාම හොඳ ප්‍රශ්නයක්. මනෝඋපදේශකත්වයේදී අප පිළිපදින ආචාරධර්ම පද්ධතියක් තියෙනවා. එතැනදී අපේ උපදේශනය සඳහා යොමුවන තැනැත්තාගේ පෞද්ගලිකත්වය සම්පූර්ණයෙන්ම ආරක්ෂා කරන්න අපි බැඳී සිටිනවා. මම වගේම ඔබේ ආයතනයේ සිටින උපදේශකවරියත් ඒ ආචාරධර්ම ඒ අයුරින්ම සුරකිනවා. ඒ නිසා ඒ අය ළඟට ගිහින් තමන්ට යම් මානසිකව ගැටළුවක්, පසුබෑමක්, සංවර්ධනය කරගතයුතු ගුණාංගයක් හෝ ආකල්පයක් තිබෙනවා නම් විශ්වාසයෙන් යුතුව ඒ දේ යොමුකරන්න. ඔබේ තරාතිරම කුමක්ද, ඔබේ ගැටලුව කුමක්ද කියන එක අදාළ කරගන්න එපා. ඔබට අවශ්‍ය නම් ඔබේ නිවසේ උදවිය සමඟ සම්බන්ධවී හෝ ඔබට අවශ්‍ය නිදහස්, ශක්තිමත් මානසිකත්වය ගොඩනගන්න අපි සූදානම්.

**ඒ සඳහා ඔබේ වැඩපිළිවෙළ...**

අපි පළමුවෙන්ම කරන්නේ හැම ආයතනයකම සිටින මනෝඋපදේශිකාවන් සම්බන්ධ කරගෙන අපේ සාමාජිකයන්ගේ මානසික සුවය පවත්වාගැනීමේදී ඇතිවන ගැටලු පොදුවේ හඳුනාගෙන සමබර ජීවිතයක් ගතකරන, චිත්ත ධෛර්යයෙන් හෙබි, දිනෙන් දින දියුණුව කරා යන, තම ආයතනයට සැබැවින්ම හිතෛශී බ්‍රැන්ඩික්ස් සමාජිකයෙක් හදන්න අවශ්‍ය පොදු වැඩපිළිවෙළක් සකස් කිරීමයි. ඒ අතරම අපේ බ්‍රැන්ඩික්ස් සමූහය තුළ සිටින මනෝඋපදේශිකාවන්ගේ එම ක්ෂේත්‍රයේ දැනුම, හැකියාව ආදිය දියුණු කරන්න තවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න මම කටයුතු කරනවා.

> ***මේ තමයි මම හැමදාම බලාපොරොත්තුවෙන් හිටපු දේ. ලෝකෙ වෙන කොහේ වැඩ කළත්, මට උවමනා වුණා මම උගත් දෙයින් මගේ රටට සේවයක් කරන්න. බ්‍රැන්ඩික්ස් හරහා හොඳම විදිහට මට ඒ අවස්ථාව හිමිවුණා.***

***ඇය උගත් ක්ෂේත්‍රය පිළිබඳ ඇගේ දැනුම ජාත්‍යන්තර මට්ටමේය. එහෙත් ඇය හදවතින්ම ශ්‍රී ලාංකිකය. ඇය ඉකුත් වසර 30 කට වැඩි කාලයක් තුළ විදෙස් රටවල් 7 ක සේවය කළාය. එහෙත් තමන්ගේ ගමනට මූලික පන්නරය ලබාදුන්, උපන් රට හෙවත් ශ්‍රී ලංකාවට කළ ගුණ සැලකීම, නොඑසේනම් තමන් උගත් දේ රටේ යහපත පිණිස යෙදවීමේ මහත් ආශාවකින් ඇය පසුවූවාය. දැන් ඇයට එම අවස්ථාව හිමිව තිබේ. ඒ ඇය බ්‍රැන්ඩික්ස් හි සමූහ මනෝ උපදේශකවරිය ලෙසින් එක්ව සිටින බැවිණි. හතලිස් අට දහසක් පමණ වන අපගේ සාමාජිකයින්ගේ මානසිකත්වය නැංවීමේ වගකීම ඇය මහත් සතුටින් භාරගෙන සිටින්නීය. ඒ උදෙසා මහත් කැපකිරීම් කරන්නට ඇය බලාපොරොත්තුවෙන් සිටින්නීය. ඔබට ඇහුම්කන් දෙන්නට, ඔබේ සිතට සවිය දීමට ඇය සැදී පැහැදී සිටින්නීය.***

**ඔබ දැන් ශ්‍රී ලංකාවේ ඇඟලුම් ක්ෂේත්‍රයේ දැවැන්තයා වන බ්‍රැන්ඩික්ස් හි සාමාජිකාවක්. ඒ සමගම ඔබට දැවැන්ත රාජකාරියක් පැවරෙනවා. හතලිස් අට දහසක් පමණ වන සෙසු සියලු සාමාජික සාමාජිකාවන්ට සාවදානව සවන්දීමට ඔබට සිදුවෙනවා. මේ සමූහයට මානසික ශක්තිය සපයන්නිය වශයෙන් ඔබ හමුවේ තිබෙන කාර්යභාරය.**

මේ තමයි මම හැමදාම බලාපොරොත්තුවෙන් හිටපු දේ. ලෝකෙ වෙන කොහේ වැඩ කළත්, මට උවමනා වුණා මම උගත් දෙයින් මගේ රටට සේවයක් කරන්න. බ්‍රැන්ඩික්ස් හරහා හොඳම විදිහට මට ඒ අවස්ථාව හිමිවුණා. මම දැනටමත් අපේ කර්මාන්තශාලා රැසකට ගොස් අවසන්. ඉදිරියේදීත් මම අපේ සමූහයේ හැම ආයතනයකටම යනවා. "ඔබට සවන්දීමට මම හැමවිටම සූදානම්" කියන කාරනය පැහැදිළිව කිව යුතුයි. ඔබ සේවය කරන ආයතනයේ සිටින මනෝඋපදේශිකාව හරහා හෝ නැතිනම් සෘජුවම මට කතා කරන්න. මගේ අංකය 0769129632. මගේ ජංගම දුරකථනය පැය 24 ම ක්‍රියාත්මකයි. මම ආවේ ඔබට මානසික ශක්තිය ලබාදෙන්න. ඔබේ මානසික සෞඛ්‍යය නංවන්න. මම ඒ වෙනුවෙන් පැය 24 ම කැපකිරීම් කරන්න ලැහැස්තියි.

**ඔබ මෙම ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර මට්ටමේ අත්දැකීම් ඇති කෙනෙක්. රටවල් කිහිපයක, සංස්කෘතීන් ගණනාවක් අතරේ තම සේවය සැපයූ කෙනෙක්. මනෝවිද්‍යාත්මක පසුබිම අතින් ලංකාවේ තත්ත්වය ඔබ දකින්නේ කොහොමද?**

මම දකින විදිහට නම් මනෝවිද්‍යාව පිළිබඳව ලංකා සමාජයේ පවතින ආකල්ප තව වර්ධනය විය යුතුයි. ලංකාවේ බොහෝදෙනා සිතන් ඉන්නේ මනෝඋපදේශනයක් ලබාගැනීමට නම් මානසික රෝගියෙක් වෙන්න ඕනෑ කියලා. නමුත් එය එසේ නෙමෙයි. ඕනෑම කෙනෙකුට සිය මානසිකත්වය සංවර්ධනය කරගැනීම සම්බන්ධයෙන්, ධනාත්මක මානසිකත්වයක් පවත්වාගැනීම සඳහා සුදුසුකම් සහිත කෙනෙකුගෙන් උපදෙස් ගන්න පුළුවන්.

**ඔබ වසර 30 කට වැඩි කාලයක් විදේශගතව සිටි කෙනෙක්. ඉතින් ලංකාවේ මේ සමාජය ඇතුළට ඇවිත් එහි ගැටෙන අය සමඟ සන්නිවේදනය කිරීම අභියෝගයක් නොවෙයිද?**

මම විදෙස් රටවල් කිහිපයකදිම ඒ ඒ සංස්කෘතීන්වල සිටින අය සමඟ මේ ගනුදෙනුව සාර්ථකව කළා. ඉතින් අලුත් සංස්කෘතියක් වුනත් ඉක්මනින් හඳුනාගැනීම මට අපහසු නැහැ. නමුත් ශ්‍රී ලංකාව කියන්නේ මගේ හදවත පිහිටි තැන. මගේ පදනම පිහිටි තැන. මගේ අවධානය හැමදාම තිබුණු තැන. ඒ නිසා ශ්‍රී ලාංකේය සමාජයේ අවශ්‍යතාව හඳුනාගැනීම මට අභියෝගයක් වෙයි කියලා හිතන්නේ නැහැ. මම වසර 33 ක් විදෙස්ගත වෙලා සිටියත් මගේ සිංහල භාෂා දැනුම හොඳටම ප්‍රමාණවත්. මගේ පියා සිංහල භාෂාව පිළිබඳ මහාචාර්යවරයෙක්. තාත්තා තරමට නම් මට භාෂා දැනුමක් නැති වුනත් හොඳට සිංහල කතා කරන්න පුළුවන් (සිනාසෙමින්...)

**සෙසු බ්‍රැන්ඩික්ස් සාමාජිකයන් වෙත ඔබට කියන්නට යම් පණිවුඩයක් තිබෙනවා නම් මේ ඒ සඳහා අවස්ථාව...**

මානසික සතුට කියන දේ හැම කෙනෙක්ටම අත්විඳිය හැකි සහ හැම කෙනෙක්ම අත්විඳිය යුතු දෙයක්. ඒ නිසා ඔබ කිසිසේත්ම මානසිකව සිරවී සිටින්න එපා. ඔබේ යම්කිසි මනෝභාවයක් ගැන මගෙන් යමක් විමසුවොත් මම ඉතා කැමැත්තෙන් ඇහුන්කන් දෙනවා. ඒ නිසා මම ඔබට හරිම උද්‍යෝගයෙන් මෙන්ම සතුටින් පිළිතුරු දෙනවා. ඒ පිළිතුරේ රැඳුණු කරුණු ඔබට සමබර ජීවිතයකට මග පෙන්වාවි. චිත්ත ධෛර්යය නංවාවි. මටත් ඉගෙන ගන්න දෙයක් තිබේවි. රාජකාරිය තුළින් සැබෑ සතුටක් ලබන අන්දම ඔබ දැනගනීවි. ඔබේ පවුල කරාත් ඒ සතුට පැතිරේවි. "බ්‍රැන්ඩික්ස්" කියන්නේ උපරිම සුබසාධනය සලසන සමාගමක්. එවන් වූ ආයතනයක රැකවරණය ලබන ඔබට ප්‍රීතිමත් ජීවිතයක් නිතැතින්ම උරුමයි.

# රිදීගම් තුළානේ අවුරුදු ජන කෙළිය

**වර්ෂ දෙදහස් දහහතේ බක් මහේ තිස් වැනි රිවි දින උදැහැනැක්කේම බ්‍රැන්ඩික්ස් රිදීගම් තුළානේ ඇත්තෝ ලහිලහියේ මොක මොකටදෝ ලකලැහැස්තිය. ආරච්චි වලව්වෙයි, වෙද ගෙදරයි, ගම ගෙදරයි, ගමේ කඩෙයි, හේන් කුඹුරු පිරෙන්න මහ සෙනඟක් අවුරුදු ජන කෙළියක් වගේ හිටං.**















සියල් දොස් නිවාරණයි කියලා බුදුන්ට පාන තියලා ඕං වැඩේ ආරම්භ කෙරුවා. බ්‍රැන්ඩික්ස් රිදීගම් තුළානේ උන් කොහොමත් දස්සයෝ. ගම් තුළාන වෙනුවෙන් කෝරළේ මහත්තයයි මැණිකෙයි ගෙහුං සන්නස් පතක් දීලා හිටං රෑහේ මහ ඒජන්ත උන්නාන්සේට ආරාධනා කෙරුවා.

බ්‍රැන්ඩික්ස් රිදීගම් තුළානේ උන් කොහොමත් දස්සයෝ. කළොත් වැඩක් මල් හතයි. බ්‍රැන්ඩික්ස් වරිගෙ සතුටින්ම ඉන්න උන් අපේ එවුන් කියලා ඒජන්ත උන්නාන්සේ දුන්න වදන් ටික කනේ මී පැණි වැක්කෙරුවා වගේ. ඕං මෙතැන ඉඳන් ගම් තුළානේ අවුරුදු විවුර්තයි කීවා විතරයි පැඟිරි ගැටිස්සියෝ නටන්න ගත්තා. කොහා සතුටින් බෙරිහන් දුන්නා. උණ වෙඩිලි පත්තු වුණා. රබන් සුරල් රැව් දුන්නා.

කෝරළේ මහත්තයා ආඩම්බරකාරයා බව හැබෑව. හැබැයි ඉතින් ආගන්තුක සත්කාරෙට පණ ඇරලා. මැණිකේ නම් කොහොමත් සත්කාරෙට ලැද්දි නොවැ. ඔක්කොමත් හරි පිනා මැණිකේ කැවුමේ කොණ්ඩේ ගන්න විදිහ කියෝනවා විතරක්යෑ කෝරළේ මහත්තයාගේ කියුං කෙරුං උජාරුවට තෙපරබානවා. කෝරළේ මහත්තයාට නහුතෙට කේන්ති ගෙහුං පිනා හොයනවා දැඩු කළේ ගහන්ඩ.

ගමේ කඩ පිළ කොල්ලෝ කුරුට්ටෝ පාරාදීසෙනේ. දාං අදිනවා. රොටී පුච්චනවා. නෙලුම් කොළේ බත් කනවා. මල් පැණින් මත් වෙච්ච පැඟිරි කොල්ලෝ පැදුරකට වෙලා හීනියට බෙග් මාස්ටර්ගේ ගීයක් මුමුණනවා. මුදලාලියා කට්ටයා. ඒජන්ත උන්නාන්සේ අල්ලගෙන ගම්මුන්ට වැඩි කාසිවලට බඩු දෙනවා කියලා ගම්මු නම් කියනවා. ඕං ආයුබෝවන්ඩ ඕවයි ඇත්ත නැත්ත අපි නම් දන්නෑ ඕං.

පුරං මාමාගේ කවි සීපදයක් උඩ පැලෙන් ඇහෙනකොට මෙහා වෙලේ හිටපු බංඩප්පුවා උත්තර බැන්දා අපූරුවට. බංඩප්පුවා ගොවිකමට දස්සයා. බොලා දන්නවයි දිය හොල්මන. ඒක බලාගන්න වරෙල්ලා රිදීගම් තුළානට. බැත, කමතේ හරි හරියට ගොයිකම් කරන හයිකාර කොල්ලන් දිහා කෙල්ලන් බලන් හිටියේ මොකක්දෝ බලාපොරොත්තුවකින් කියලා උන්ගේ ඇහේ ලියවිලා තිබුණා බොලං.

කෝරළේ වලව්ව තරම් ගමගේ මහ විශාලෙට නොතිබුණට ගමරාළයි ගම මහගේයි දෙයියෝ බුදුන්ට පාන තියලා මහතැන්ලා ආයුබෝං කියලා පිළිගත්තා. ගම ගෙදරින් ආපු බටලී හඬ සියල් දුක් දොම්නස් වා තලයට මුහු කළා වගේ දැනුනා ආයුබෝවන්ඩ. ගමේ කොරේ හයිරන්කාරයත් පොඩි එකාලත් ලොකු පොඩි කොයි අමාරුවටත් තෙල් බෙහෙතක් කර ගන්ට ගාටන්නේ වෙද මාමා ළඟට. උන්දෑ ඉතින් කාසි පනං ඉල්ලන එකක් යෑ. නාඹර කොල්ලන් තෙල් සාත්තුව කොර ගත්තේ කෙළිරිගගා ආයුබෝවන්ඩ.

වන සිවුපාවුන්ගෙන් හේන් කුඹුර රැකගන්ට උණ වෙඩිල්ලක් පත්තු වෙන අතරේ ගම් තුළානේ හිච්චි පිච්චි කෙල්ලන් කමතට වෙලා අත පය විසි කොරනවා. තාම ඉතින් හය හතරක් තේරෙන උන් යෑ ආයුබෝවන්ඩ.

ඕං බොලේ ගම් තුළානේ කිරි අම්මලටත් පැඟිරි විසේ ගහලා. ගම් කොරේ ළමිස්සියන්ට පද හදන්න වගේම රබන් පද ගහන්නත්, ලස්සනට නටන්නත් උන්දැලා දස්සියෝ. ඒ නිනව් අස්සේ ලොන්චි අක්කා මුලු ගමම සිනා සාගරේක ගිල්ලෙව්වා මලණ්ඩි.

ගම් තුළානේ අවුරුදු සිරිය හැම දොහොකම. ජන කෙළිවලට කොල්ලෝ කෙල්ලෝ පැන පැන එන්නේ ආයුබෝවන්ඩ. මොකෑ තෑගි භෝග මහ ගොඩයි නොවැ. පැණි බඹරේ කැරකැවිල්ලයි, කණා මුට්ටියයි, කඹ ඇදිල්ලයි ගජරාමෙට ගියා ඕං. කොට්ටා පොර කෙළිය කාගේත් හිත් ගත්තා ඕං. ඇස් ගෙඩි අතට අරන් බලන්ට වැඩේ කෙල්ලොත් උඩ නැගන් කොට්ටා පොර ගහනවා ඕං දැක්කාමයි ආයුබෝවන්ඩ. ඒ අස්සේ ගමේ ගැටව් කඩපිළට එක්කාසු වෙලා බජව්වක. ගැටිස්සියන්ට සිල්ප පෙන්නන්නත් එක්කලා.

ටීටර්, ජහුටා නටලා තෙම්පරාදු වෙච්ච උන්ට මේවත් කජ්ජක්ද ආයුබෝවන්ඩ. හරියට නාඩගම් මඩුවක් වගේ මුන්ගේ රංගනේ.

මේං ඉන්වා ගම් කොරේ හැඩකාරියොයි, හැඩකාරයොයි. ඔක්කොමත් හරි කියහල්ලකෝ ඉර දෙයියෝ හැංගිලා යන ගොම්මනේ ගම්මානෙට ආපු විසේකාර කොල්ලෝ රැළක් හෙණ පුපුරන සද්දෙට දුන්න සංගීතේ... මේ නාකි වුණත් තාම නැටවෙනවාමයි පුතේ.

**සටහන : ලලිත් ජයසිංහ**
**ඡායාරූප : සමීර මධුසංක**
**කැෂුවල්වෙයා(ර්)**
**රිදීගම**







# වියමන්

ප්‍රබෝධය අභියි

ලිපිනය: නො: 409, ගාලු පාර, කොළඹ 03 | දුරකථනය: 94(0) 11 4727222
ඊ-මේල්: info@brandix.com | වෙබ් අඩවිය: www.brandix.com
ෆේස්බුක් පිටුව: facebook.com/viyaman


බලාපොරොත්තු... ඒක හරි සුන්දර වචනයක්. මොකද බලාපොරොත්තු තමයි මිනිස්සුන්ට ජීවත් වෙන්න දිරිය සහ ආශාව සපයන්නේ. බලාපොරොත්තු, සිහින, අපේක්ෂා, පරමාර්ථ, අරමුණු ආදි විවිධ නම්වලින් අපට හඳුන්වන්න පුළුවන්. නමුත් ඒ මොන නම්වලින් හැඳින්වුවත් ඒ හැමදේකින්ම කියන්නේ අනාගතයේ අපි, අපි වෙනුවෙන් ළඟාකර ගතයුතු තත්ත්වයක්...

"සයිබර් අවකාශය" මෙවලමක් විදිහට මුළු ලෝකයම වසඟයට ගනිද්දී, බහුතරයක් මිනිස්සුන් කියවීමෙන් ඈත් වෙලා මුහුණු පොත බලද්දී, "වියමන් අපි" මේ සම්මත ධාරාවෙන් එළියට ඇවිත් ගුණාත්මක බවින් පිරිපුන් රසවත් වියමනකින් ඔබේ හදවත වියන්නේ අර ඉහත කිව්ව බලාපොරොත්තුවලට ඔබට යන මාවත තව තවත් ඉක්මන් කරන්න, ලස්සන කරන්න. මොකද අතීතය කියන්නේ මතකයක්, අනාගතය කියන්නේ සිහිනයක් සහ වර්තමානය කියන්නේ සැබෑවක් වන නිසා. අතීතයේ ඉඳන් අද දක්වා මේ ලෝකය වෙනස් කරපු මිනිසුන් බොහෝමයක් හිටියා. ඒ හැමදෙනාම ඒ තත්ත්වයට ළඟා වුයේ නිකන් ඉඳලා නෙවෙයි. අතීශයින්ම දුෂ්කරතා මධ්‍යයේ නොයෙකුත් බාධා මැද තමයි ඔවුන් ජය ගත්තේ. ඉතින් ඇයි ඔබට බැරි... ජයග්‍රහණය කියන්නේ ජයගන්නා විදිහට වැඩ කරන මිනිසුන්ට ලැබෙන දෙයක් මිසක් ජය ලැබෙනකන් බලා සිටින අයට ලැබෙන දෙයක් නෙවෙයි.

මේ හේතු කාරණා ඔබට කියන්න හේතු වුණේ අපේ ආදරණීය බ්‍රැන්ඩික්ස් මාතාව නැවත වතාවක් ගෝලීය ගැනුම්කරුවන්ගේ සම්මානයෙන් පිදුම් ලද ඒ සුබ ආරංචිය ඔබ දෙසවන්වලට, දෙනුවන්වලට දැනෙන්නයි. එවන් සම්මානනීය ආයතනයක සාඩම්බර පුරුකක් වීම ඔබට ආඩම්බරයක්. ඒවගේම ජීවිතවලට ජීවය සපයන රුධිරය පරිත්‍යාග කිරීමේ ප්‍රමුඛයා ලෙස පිට පිට සත් වන වතාවටත් බ්‍රැන්ඩික්ස් නාමය ලක් අඹරේ සටහන් වන්නේ ඔබගේ අප්‍රතිහත, නිර්ලෝභී පරිත්‍යාගය නිසා. පරිසරය ගැන කවදත් උනන්දුවන අපි ඒ පරිසරය හා සම්බන්ධීකරණය වීමේ ඇති සමාජීය වැදගත්කම ගැන කතාකරන්නේ කාලීන අවශ්‍යතාවයක් නිසා. ඒ සමඟ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කරන ඔබ වෙනුවෙන් ශක්තිමත් වු උපදේශන සේවයේ ඉදිරි ඉලක්කයන් ඔබ හමුවේ කියන්න වියමන් අපි සූදනම්.

වෙනදා වගේම, යන යන තැන ලස්සන දකින හෂාන්ගේ වියමන් ගමන්, කවි පද දෙකකින් උපදෙස් දෙන බණ්ඩාරි නෝනා, නොනිම් මෙහෙවරක් වු බ්‍රැන්ඩික්ස් සමාජ සත්කාර මෙන්ම දූවරුන්ට වගේම පියවරුන්ට වැදගත් වෙන ගී වියමන් ලිපිවලින් අපිට අවශ්‍ය කරන්නේ ඔබේ ඊළඟ අනාගත සිහිනයේ සැලසුම නිසි ආකාරයෙන් හදන්න.

අවසාන වශයෙන් ඔබට යමක් කියන්න තියෙනවා. අපිට අවශ්‍ය කියවන්නන් බිහිකරන්න. ඒ තුළින් මේ ලෝකය වෙනස් කරන ඊළඟ මිනිස් පරම්පරාව බ්‍රැන්ඩික්ස් තුළින් හදන්න...


ඒ නිසා...

කවදවත් කාටවත් ඔබේ සිහින නැති කරන්න දෙන්න එපා.

ජයවේවා...

මොහාන් සුරවීර


ප්‍රධාන කර්තෘ: මොහාන් සුරවීර | උප කර්තෘ: රේණුකා බණ්ඩාරිගොඩ | කර්තෘ මණ්ඩල සාමාජිකයින්: අශෝකා සේනාරත්න, හෂාන් ගුණසේකර, ගීත් මධුර, ගයනි තාඹුගල
"මෙහෙවර" සංස්කරණය: උදර අතපත්තු | උපදේශකත්වය හා මගපෙන්වීම: අනුක් ද සිල්වා සහ අනුෂ්ක ගුණසෝම | සම්බන්ධීකරණය, නිර්මාණ සැකසුම සහ කවරය: BT Options
මෙම කලාපයේ පළවන බොහෝ නිර්මාණවල ඡායාරූප සඳහා පෙනී සිටින්නේ බ්‍රැන්ඩික්ස් සමූහ ව්‍යාපාරයේ සොයුරු සොයුරියන්ය.


## බණ්ඩාරි නෝනාගෙන් අහන්න



| | | |
|---|---|---|
| **පැනය :** | දරුවන් දෙදෙනෙකුගෙ පියෙක් කොල්ලා වගේ | රඟපානව |
| | පොඩි කෙල්ලගෙ අත අල්ලන් සිදාදියේ රවුම් | යනව |
| **පිළිතුර :** | වයස ගියත් මොනව උනත් වදුරන් නැහැ බිම | යන්නේ |
| | මිනිස් සතා හඳුන ගන්න කාටද අද හැකි | වෙන්නේ |
| **පැනය :** | අතීතය සුන්දරයි වින්ද දුක් | අපමණයි |
| | අනාගත පැතුම් ගැන සිතන්නත් මට | බයයි |
| **පිළිතුර :** | අතීතය ගැන සිතා දුක් වෙලා පලක් | නෑ |
| | අලුත් හෙට දිනක් ගැන සිතන්නකො දුකක් | නෑ |
| **පැනය :** | විපත් කරදරමයි හැම තැන මොකද මේ ගැන ඔබ | සිතන්නේ |
| | දුගී දුප්පත් අහිංසක අය තමයි අදටත් | දුක් විඳින්නේ |
| **පිළිතුර :** | අපි කරන වැරදි ගැන උරන වු | ස්වභාදම |
| | රිද්දනව අපේ සිත් වරින් වර | හොඳටෝම |
| **පැනය :** | ඩෙංගු මදුරුවෝ බෝවෙලා දැන් රටේ හැම තැන ජය | නගද්දි |
| | තවම නින්දෙද අපේ ලොකු අය දරුවෝ තැන තැන මිය | ඇදෙද්දි |
| **පිළිතුර :** | මදුරුවන්ට ජීවත්වෙන තැන් හදලා | බෝකරලා |
| | තව අයෙකුට වැරදි දෙන්න දැන් හැමෝම පුරුදු | වෙලා |
| **පැනය :** | ස්මාට් ෆෝන් එක හැමෝටම හුරු | වෙලා |
| | සෙල්ෆි ගහන්නට ගිහිල්ලා ජීවිතත් නැති | වෙලා |
| **පිළිතුර :** | හොඳ දෙයින් ප්‍රයෝජන ගන්න දන්නැති | කමින් |
| | රටම දැන් අගාධෙට ගිහිල්ලා | හිමිහිමින් |

# “நீங்கள் கூறுவதைச் செவிமடுப்பதற்கு நான் தயார்” குழுமத்தின் உளவியல் அபிவிருத்தி ஆலோசகர் பேஷலீ பெர்னான்டோ



அவரது கல்வி மட்டத்தில் அவரது தரம் சர்வதேச மட்டத்திலானதாகும். எனினும் அவர் தற்போது உளப்பூர்வமான இலங்கையராவார். அமெரிக்காவின் கலிபோர்னியா பிராந்தியப் பல்கலைக்கழகத்தில் பட்டம் பெற்று உளவியல் சுகாதாரம் பற்றிய அங்கீகாரம் பெற்ற தொழில்வாண்மையாளராகிய அவர், அதே பல்கலைக்கழகத்தில் உளவியல் நிபுணராக நியமிக்கப்பட்டதுடன் அவர் வெகுவிரைவில் களனிப் பல்கலைக்கழகத்தின் உளவியல் பேராசிரியர் பட்டத்தைப் பெற்றுக் கொள்ளவுள்ளார். அவர் கடந்த 30 வருடங்களுக்கும் மேற்பட்ட காலத்தினுள் 8 நாடுகளில் பணியாற்றியுள்ளார். தற்போது அவர் பிரெண்டிக்ஸ் குழுமத்தின் உளவியல் ஆலோசகராக இணைந்துள்ளார். ஏறத்தாழ ஐம்பதாயிரம் பேர் உள்ள எமது உறுப்பினர்களின் மனோநிலையினை மேம்படுத்துவதை அவர் மிகவும் மகிழ்ச்சியுடன் பொறுப்பேற்றுள்ளார். அதற்காகப் பாரிய அர்ப்பணிப்பினை மேற்கொள்வதற்கு அவர் தயாராகவுள்ளார். நீங்கள் கூறுவதைச் செவிமடுப்பதற்கு, உங்கள் உள்ளத்தை உறுதிப்படுத்துவதற்குத் தயாராகவுள்ள அவர் பேஷலீ பெர்னான்டோ எனும் பெயர் கொண்டவராவார். பிரெண்டிக் குழுமத்தின் உளவியல் ஆலோசகருடன் நாம் மேற்கொண்ட கலந்துரையாடலின் சுருக்கம் பின்வருமாறு.

**கேள்வி- பிரெண்டிக்ஸ் நிறுவனத்தில் உங்களது பணிகள் எவ்வாறானவையாகும்?**

பதில்- உலகில் எங்கு பணியாற்றினாலும் நான் கற்றவற்றைப் பயன்படுத்தி எனது நாட்டுக்குச் சேவை செய்ய வேண்டுமென்பதே எனது எதிர்பார்ப்பாகவிருந்தது. பிரெண்டிக்ஸ் மூலமாக அந்த வாய்ப்பு எனக்கு நல்ல முறையில் கிடைத்தது. நான் இதுவரையில் எமது தொழிற்சாலைகள் பலவற்றிற்குச் சென்றுள்ளேன். ஏதிர்காலத்தில் நான் எமது குழுமம் முழுவதற்கும் செல்வேன். “நீங்கள் கூறுவதைச் செவிமடுப்பதற்கு நான் தயார்” எனும் விடயத்தை தெளிவாக உங்களுக்குக் கூற வேண்டும். நீங்கள் பணியாற்றும் வலயத்திலுள்ள உளவியல் ஆலோசகர் மூலமாக அல்லது நேரடியாக என்னைத் தொடர்பு கொள்ளவும். எனது கையடக்கத் தொலைபேசி 24 மணித்தியாலமும் இயங்குகின்றது. உங்களுக்கு மனவலிமையை ஏற்படுத்தவே நான் வந்துள்ளேன். உங்களது உளச் சுகாதாரத்தை மேம்படுத்துங்கள். நான் அதற்காக 24 மணித்தியாலத்தையும் அர்ப்பணிப்பதற்குத் தயாராகவுள்ளேன்.

**கேள்வி- உளவியல் பின்னணியின் அடிப்படையில் இலங்கையை நீங்கள் எவ்வாறு நோக்குகின்றீர்கள்?**

பதில்- எனது கண்ணோட்டத்தில் இலங்கையில் அது பற்றிய நோக்கானது மிகவும் குறைந்த மட்டத்திலேயே உள்ளது. ஆனால் அது அவ்வாறல்ல. உளவியல் ஆலோசனை பெற வேண்டுமாயின் மனநோயாளியாக இருக்க வேண்டுமென அநேகர் கருதுகின்றனர். யாராவது தனது மனோநிலையை விருத்தி செய்து கொள்வது தொடர்பில் சாதகமான மனோநிலையைப் பெற்றுக் கொள்வதற்காக தகுதிவாய்ந்த ஒருவரின் அறிவுரையைப் பெற்றுக் கொள்ள முடியும். இந் நிறுவனத்தினுள் ஏற்பட்டுள்ள கலாச்சாரத்தினூடாக என்னால் அவ்வாய்ப்பினை மிக உயர்ந்த முறையில் வழங்க முடிவதுடன் உங்களுக்கு அவ்வாய்ப்பின் மூலமாக உயரிய பயனைப் பெற்றுக் கொள்ளக் கூடிய சூழ்நிலை உருவாகியுள்ளது.

**கேள்வி- பிரெண்டிக்ஸ் உறுப்பினர்களுக்கு நீங்கள் ஏதேனும் செய்தியைக் கூற விரும்புவீர்களாயின் அதற்குரிய சந்தர்ப்பம்.**

பதில்- மனமகிழ்ச்சியென்பது அனைவரும் அனுபவிக்கக் கூடியதாகும். அதனால் நீங்கள் எப்போதும் மனஅழுத்தத்துடன் இருக்க வேண்டும். நான் நீங்கள் கூறுவதைச் செவிமடுக்க விருப்ப முள்ளவர். உங்களது ஏதேனும் மனோநிலை பற்றி நீங்கள் என்னிடம் ஏதேனும் கேட்பீர்களாயின், அவ்வாறு கேட்பதினால் எனக்கும் ஏதாவதொன்றைக் கற்றுக் கொள்ள முடியும் என நான் நினைக்கின்றேன். ஆகையால் நான் உங்களுக்கு அதிக ஆர்வத் துடனும் மகிழ்ச்சியுடனும் பதிலளிப்பேன். அப்பதிலி லுள்ள விடயங்கள் உங்களது சமநிலையான வாழ்விற்கு வழிகாட்டும். மனவுறுதி அதிகரிக்கும். தொழிலின் மூலம் உண்மையான மகிழ்ச்சியைப் பெறும் விதத்தை நீங்கள் அறிந்து கொள்வீர்கள். உங்களது குடும்பத்திலும் அம்மகிழ்ச்சி வியாபிக்கும். இந்நாட்டில் ஏனைய நிறுவனங்களுடன் ஒப்பிடுகை யில், பிரெண்டிக்ஸ் நிறுவனமானது உங்களுக்கு உயர்ந்தளவு நலன்புரிச் சேவைகளை வழங்கும் நிறுவனமாகும். அத்தகைய நிறுவனமொன்றின் பாதுகாப்புப் பெறும் உங்களுக்கு சிறந்த மனோநிலையொன்றினைப் பேணிவருவது எவ்விதத்திலும் அசௌகரியமாகாது.

## ஒரு தசாப்த காலமாக உங்கள் சேவைக்காக உருவாக்கப்பட்ட நீர்வரம்

இன்றைக்குப் பத்து வருடங்களுக்கு முன்னர், உங்களது குடிநீர்த் தேவைக்குத் தீர்வு வழங்குவதற்காக நாம் ஆரம்பித்த நீர்வழங்கும் நிகழ்ச்சி தற்போது இலங்கை முழுவதும் வியாபித்து பத்தாயிரம் பேருக்குக் குடிநீர் வசதிகளை வழங்கியுள்ளது. பத்து வருடம் என்பது குறுகியதொரு காலமல்ல. அது போன்றே காலம் பூராகவும் எம்மால் ஆரம்பிக்கப்பட்ட நீர் விநியோகத் திட்டங்கள் சிறியவையல்ல. அன்று இந்நீர் விநியோகத் திட்டம் மூலமாக நீர் விநியோகத்தைப் பெற்றுக் கொண்ட முதலாவது உறுப்பினர் ரேணுகா ஆவார். அவ்வாறு ஆரம்பிக்கப்பட்ட நீர் விநியோகத் திட்டங்களில் பிரெண்டிக்ஸ் உறுப்பினர்கள் மாத்திரமல்ல. அவர்களது கிராமத்தவர்களும் அந் நன்மையைப் பெற்றுக் கொண்டார்கள் என்பதை நாமனைவரும் அறிவோம். ரேணுகா போன்று இக்கருத்திட்டம் மூலமாக தமது நீர்த் தேவையை நிறைவேற்றிக் கொண்ட மட்டக்களப்பைச் சேர்ந்த ரசிகலா தனது மனப்பூர்வமான நன்றிகளை இவ்வாறு தெரிவித்துக் கொள்கிறார்.



பரமலிங்கம் ரசிகலா ஆகிய நான் மட்டக்களப்பு கொத்தியாபுலை எனும் கிராமத்தில் வசித்து வருகின்றேன். எனது குடும்பத்தில் மொத்தம் 6 பேர் உள்ளனர். எனது அப்பா வயது முதிர்ந்தவர் என்பதனால் எனது அம்மாதான் அன்றாடம் கூலி வேலை செய்து எங்களைக் கவனித்து வந்தார். கடந்த இரண்டு வருடங்களாக நான் பிரண்டிக்ஸ் எசென்ஷல் நிறுவனத்தில் இயந்திர இயக்குனராக வேலைசெய்கின்றேன்.

எமது பிரதேசத்தில் குடிநீர் பெற்றுக்கொள்வது மிகவும் சிரமமாக இருந்தது. நாங்கள் குடிநீர் பெறுவதாக இருந்தால் எமது வீட்டில் இருந்து 4 கிலோ மீற்றருக்கு அப்பால் சென்றுதான் பெற்றுக்கொண்டோம். இவ்வருடம் பிரண்டிக்ஸ் நிறுவனத்தினால் எமக்கு குழாய்க்கிணறு ஒன்று அமைத்துக் கொடுக்கப்பட்டது. இதன் மூலம் எனது குடும்பமும், எமது கிராமத்தில் இருக்கின்ற 10ற்கு மேற்பட்ட குடும்பங்களும் எங்களுக்கு வழங்கப்பட்ட குழாய்க்கிணறு மூலம் குடிநீரைப் பெற்று எங்களுடைய அன்றாட தேவையைப் பூர்த்தி செய்துகொண்டிருக்கின்றோம்.

என்னையும், என்னுடைய கிராமத்து மக்களையும் மதித்து எங்களுடைய குடிநீர்த் தேவையை நிறைவேற்றுவதற்கு எங்களுக்கு உதவி புரிந்த பிரண்டிக்ஸ் நிறுவனத்திற்கு எனது மனமார்ந்த நன்றியினைத் தெரிவித்துக்கொள்கின்றேன்.

பரமலிங்கம் ரசிகலா
எசென்ஷல்
மட்டக்களப்பு

## எல்லா இடங்களிலும் எதிரொலிக்கும் பிரெண்டிக்ஸின் பெயர்



விருது பெறுவதானது பிரெண்டிக்ஸ் நமக்கு புதிதானதொன்றல்ல. அதற்குக் காரணமாவது நாம் பல்வேறு துறைகளில் பல்வேறு விருதுகளைப் பெற்றமையாகும். ஒருதடவை உற்பத்திச் செய்முறைக்காக விருது பெற்றோம் இன்னொரு முறை நிலைபேறு, மனிதவள முகாமைத்துவம், சமூக சேவைகள் போன்றவை தொடர்பில் விருது பெற்றுள்ளோம். இன்னொரு முறை சூழல் நிகழ்ச்சிகளுக்காகவும் விருது பெற்றோம். குழுமமென்ற வகையில், நாம் விருது பெற்ற சகல சந்தர்ப்பங்களிலும் கௌரவிக்கப்படுவது எமது ஐம்பதினாயிரத்தை அண்மித்த உறுப்பினர்களே என்பது நாம் அடிக்கடி கூறி வரும் விடயமொன்றாகும். நாம் பெற்ற கௌரவங்களுக்கு மத்தியில் விசேடமாவது கடந்த நாட்களில் பெற்ற பெறுமதிமிக்க ஏற்றுமதி வியாபாரப் பெயர் எனும் தரப்படுத்தலாகும்.

அது 2017 ஆம் ஆண்டு அறிவிக்கப்பட்ட பிரேண்ட் பைனான்ஸ் தரப்படுத்தலில் இலங்கையின் பெறுமதிமிக்க ஏற்றுமதி வியாபாரப் பெயராகும். என்பதுடன் Gap Inc. ஆனது ஆண்டின் மிகச் சிறந்த வழங்குநர் மற்றும் சமூகப் பொறுப்பு மற்றும் நிலைபேறிற்கு எம்மால் வழங்கப்படும் சிறந்த செயலாற்றலை மதிப்பிட்டு PVH நிறுவனத்தினால் வழங்கப்பட்டது.

# මැණික මම සහ අපේ ගම

තුමුල සමනොළ සිරස හිමන සනහන සිසිල
අපේ ගම් ගෙවල් පසුකර ගියා...
මිණි පළඟ ළය ලෙහි තාඹුවට දුන් එළිය
නිල් මැණික රන් මිටෙහි ගුලි වුණා...

ලුණු කැඳට ගෙන දළම සුරත කරගැට නෙළුව
මැදුරු කුස රස බොජුන් වැපුරුවා...
ගොඩට ආ නිල් මැණික ගුවන් පථයෙන් ඉගිල
"හෝ ගාන" පොකුණ මත පියැඹුවා...

සනුහරේ අලි ඇතුන් ඇවිත් පැන් පහසු වුණා
නදී දිය ගමෙන් පිටමන් වුණා...
ඒ ඉතිරි දිය බිඳට පෙම් බැන්ද කුඩ මසුත්
රොන් මඩෙහි හති හලා මියැදුණා...

සිරි පතුල වැඳ ගලන කළල් පිරි ගං දැල
සිහින් ඉකිබිඳුමකින් නැවතුනා...
මෙල්ල නැති ගිජිඳුනට සළඹ දී පෙරහැරට
සුර ගමන් රජිඳාන සැතපුණා...

හොඳම නිර්මාණය සඳහා නිර්දේශිතයි

**කේ.ඒ.පී. මධුභාෂිණී**
**එසෙන්ෂල්ස්**
**කහවත්ත**



# සන්නාලිය

ඔබෙන් රිදවුණු හදෙන් නැඟෙනා - සුසුම් වැල් අමතක කරන්නම්
ඔබේ දසුනින් නෙතින් ගලනා - කඳුළු කැට සඟවා තබන්නම්
හදේ ගැඹුරුම තැනක ලියවුණු - ඔබේ නම නොකියා සිටින්නම්
මගෙන් සමුගත් වසන්තය ඔබ - සෙනෙහසින් ආසිරි පතන්නම්...

එදා ඔබ මැවූ හීන ලෝකය - දැනුදු සිහියට නැඟෙනවා
සඳට තරු කැටවලට මගෙ දුක - පවසමින් ඉකි ගසනවා
නැගෙන හිරුටත් වඩා මහ දුක් - හදවතින් මම විඳිනවා
හඬන්නට බැරිකමට හිනැහෙන - අසරණීය දුක් විඳිනවා...

ගතේ දහදිය මවා රන්මසු - දෑත ගෙත්තම් මවනවා
හීන තරුමල් දෝතටම ගෙන - අහස් මාලිග මවනවා
දෙනෝ දාහක් කරන අවමන් - දෙනෙත කඳුළින් තෙමනවා
සළු ගොතන සන්නාලියකි මම - ජීවිතේ මග සොයනවා...

සඳ බලන්නට තරු ගනින්නට - නොවේ පෙරුමන් පුරන්නේ
ගත පිනන්නට දිව මිහිර රස - නොවේ ඔබගෙන් යදින්නේ
කඳුළු දහදිය රුහිරු එක්කර - දිවිය ගෙත්තම් කරන්නේ
කියන් මේ දුක් කඳුළු පිසදා - කෙලෙසකද මට සතුට දෙන්නේ...

නෙතින් ගලනා කඳුළු සඟවා - මුවින් සිනහා මවනවා
හමන සුළඟට පවා රහසින් - සුසුම් වැල් මගහරිනවා
සිතින් පතනා පැතුම් ඉටුවන - නියත ජය මග සොයනවා
ජීවිතේ මග දිනන තුරු මම - ගොතනවා සළු ගොතනවා...

**බී.ඩබ්ලිව්.ඒ.ඩී. කුමාරි**
**කැෂුවල්වෙයා(ර්) - රිදීගම**

# පතිනිය මමයි සැමදා

අලුයමට කල් ඇතිව
සයනය සොයන තුරු... නෙත් යුග
තුන් තිස් පැය පුරා
අනලස් නොවී කිසිකල
තුටින් කරනෙමි සෑම කටයුතු...

නෑ සිය හිත මිතුරු කැල
ඔබ නම මතුරා, ආවේද? නිවසට
අසතුටින් ගියේද? කිසිවෙකු
කිසි කලෙක...

අග හිඟ තිබුණද හැමවිට
කැණිමඬලේ වරපට
මම... බව,
දකිමි. සිහිනෙනුදු...
අපහසුවෙන්, වුවද
රකින කාසිය... හෙට,
තනයි අපෙ සිහින මාළිගාව.

"නකුල මාතා" මා... බව
සිතමි. දිවි ඇති තුරා...
පතමි! මා,
දේවතාවෙකු... ඔබෙන්,
දේවතාවියක ලෙසින්,
සැමදා...

**බුද්ධිකා කුමාරි**
**ඇත්ලෙෂර් - පොළොන්නරුව**

# රාවන හිත

පෙම් කවක් ලියන්නම් සීතාට
හිත ඇදලා ගත්ත හැටි කියන්නට
කටුක වූ මගේ රුදුරු හිත ගාව
නැවතුනේ මගේ සොඳුරු සීතාව

ඇද හැලෙන ඇල්ල වගේ කෙස් කළඹ
මිහිරි හඬ වීනාව මගේ පරදවන
නළලේ හරි මැදට වූ කුංකුමද
මවනවා දෙව්ලියක් මිහිමතම

සප්ත කන්‍යාවියෙන් හමා එන
සීතල සුළං රැළි හැමදාම
නුඹේ ගුණම කියපු හැටි කොඳුරාන
තවම මට මතකයිනේ සීතාව

දස වසක් අතක්වත් නොතියාම
රැක්කා නුඹේ පතිවතත් පණ සේම
සිර කරන් සිටියාට මගේ සොඳුර
දුකක් නම් දුන්නේ නෑ ඔය හිතට

ජීවිතේ රජ දහන නුඹ ගාව
නුඹ නැතුව පලක් නෑ දඬුමොණර
ගින්දරට පනින්නට නුඹට කිව් රාමාට
වඩා අගනේය නුඹ නමින් ගිනි තැබූ හනුමාව

හොඳම නිර්මාණය සඳහා නිර්දේශිතයි

**එල්.එස්. මල්ෂිකා**
**ෆාස්ට් ෆැෂන් - වැලිසර**





# සිතක සෙනෙහස

ඔබ සිහිවන හැමවිටකම සිත රිදෙනා තරම
අවිහිංසක සිත ඇතුලේ කඳුළකි ඉකිබිඳින
කවදා හෝ සමුගත්තම එතකොට සිහිවෙන්න
පද හතරක් ඔබට ලිව්වා මාව මතක් වෙන්න

හදෙහි රැඳුන බව සත්තයි සෙනෙහස ඉකිබිඳින
ළෙන්ගතුකම නෑ කාටත් ඔබට තරම් මෙහෙම
දවසේ කොයි මොහොතක හෝ තනි වුනොතින් එහෙම
මගෙ නෙතු පවසන කතාව සෙමෙන් සිහිකරන්න

**රසිකා මනෝජි**
**එසෙන්ෂල්ස්**
**රත්මලාන**

# අහිමි ඔබ

සංසාරෙන් ආ පැතුමක් විලසට ඔබ මා මේ ලෙස හමුවූවා
මම විඳි දුක් ගිනි කියන්න බැහැ මට ඔබෙ නෙතගේ අද කඳුළු නිසා
හිමි නැති පෙමකට ළංවී අපි අද අපේ නෙත් කඳුළින් පිරිලා ගියා
අපේ ආදරේ හිමි නැහැ අප හට වෙන කෙනෙකුට අපි අයිති නිසා

ඔබේ මුව දකිනා හැම මොහොතකදිම නෙතගේ කඳුළැල් පිරෙන නිසා
සුමිහිරි වදනක් කෙසේ අසන්නද ඔබේ හදවත ඉකි ගසන නිසා
අපේ ආදරේ කෙසේ රකින්නද අපි අද දෙතැනක රැඳෙන නිසා
මතු භවයේ වත් අපි අපේ වෙන්නට පතනෙමි පැතුමක් මලක් පුදා

**ඕ.පී. සුනේත්‍රා**
**එසෙන්ෂල්ස්**
**කොග්ගල**

# மகளீர் மட்டும்

கருதனில் மங்கைராய் பிறந்து
வயிற்றில் குழந்தைகளை சுமந்து
உன்னை அவள் உயிர் உள்ளவரை
கைகளால் ஏந்துவாள் - ஆனால்
அவளை மற்றவரிடம் கை
ஏந்த வைத்து விடாதே.

**ஹீரோ பிரநீத்**
**எசென்ஷல்ஸ்**
**மட்டக்களப்பு**

# මේ ඔබේ ඉඩයි

**ඔබගේ ගීත, පද්‍ය හෝ ගද්‍ය නිර්මාණයන් පසු පිටේ සඳහන් කර 2017 අගෝස්තු මස 04 වැනිදාට පෙර මානව සම්පත් අංශය වෙත භාර දෙන්න. පළමු ස්ථානයට රු. 5000 ක්, දෙවන ස්ථානයට රු. 3000 ක් සහ තෙවන ස්ථානයට රු. 2000 ක් වටිනා ත්‍යාගයන් සහ සැනසිලි ත්‍යාග අපෙන්.**

නම :........................................................
........................................................

සේවා අංකය :........................................................

ආයතනයේ නම :........................................................

ඔබට හිතෙන,
දැනෙන සහ පෙනෙන දෑ
පද පෙළකට
ගෙත්තම් කර
එවන්න අප වෙත.
ඔබේ නිර්මාණයට
වියමනෙන් ඉඩක්
වෙන් කරන්න
අපි සූදානම්.



## වියමනට ගෙත්තම් ජයග්‍රාහකයෝ



**බලා ඉන්න අම්මා**
නුවන්තිකා ප්‍රානාන්දු
සෙන්ටර් ඔෆ් ඉන්ස්පිරේෂන්ස්
ඒකල



**මතක පොත**
දිල්හානි වීරවර්ධන
ෆාස්ට් ෆැෂන් 2
මීරිගම



**සෙනෙහසක ඉරණම**
ඩී.පී. සුමුදු කුමාරි
ෆාස්ට් ෆැෂන් 2
මීරිගම

**නුවන්තිකාට, දිල්හානිට සහ සුමුදුට අපගේ උණුසුම් සුබ පැතුම්!**



# මා ඔබේ පතිනියයි

ජීවිතය හැඩ වෙන්න - ආදරයට පාට දෙන්න
ලස්සන සිහිනය දකින්න - මම ඉන්නෙමි දිවිතුරාම

දැඟකරනා හදවතකට - තරවටු බැල්මක් හෙලන්න
මටත් හොරෙන් සිත් අහසට - ළං වූවෙමි ඔබේ දිවියට

නෙත් ඉඟිපා දිළෙන්න - සුසුමක සුවය දැනෙන්න
ඔබේ ළඟම උණුසුම වී - ඔබේ වෙහෙස දුරුකළෙමි

හදවත මහ පොළව මතින් - සරුකරනා රුකක් වෙමි
ඔබේ විඩා නිවාලන්න - නිරතුරු මා සවිය වෙමි

**එම්. සෙව්වන්දි**
**ඇත්ලෙෂර්**
**පොළොන්නරුව**

# මගෙ දේණිගේ උපන් දිනේ

සිලිසිලි හඬින් බෝ සමිඳුන් රැව් දුන්නේ
සුදු මල් වට්ටි බෝ සමිඳුන් හට පිදුවේ
මගෙ එක සිතින් බෝ සමිඳුන් හට වැන්දේ
කිරි දරුවෙකුයි බෝ සමිඳුන් ගෙන් පැතුවේ

දින සති මාස ගෙවිලා යනවා දැනුනේ
මගෙ නෙතු සතුටු කඳුළුයි රූරා වැටුනේ
මව් සෙනෙහසක අරුමය නුඹ නැහැ දන්නේ
දහසක් පැතුම් මා හදවත ගොඩ ගැසුනේ

බුදු සමිඳුන්ගෙ තෙමඟුල් දින උදා වුණේ
සීතල සුළඟ දසතින් පිරී ඉතිරී ගියේ
මැයි මස 23 යි ඔබ මේ ලෝකෙට ආවේ
දෙව්ලොව වගේ සුරදූතිය මගේ අතේ

හැමදාමත් මගෙ සෙනෙහස ඔබට දුවේ
නිරතුරුව හෙවණැල්ලක් වෙනවා දුවේ
සිව් වැනි වියට පා තැබූ මගෙ චූටි දුවේ
ආසිරි පතන්නෙමි අම්මා ඔබට දුවේ

**ඩබ්ලිව්. ඒ. දිස්නා සමන්ති**
**ෆාස්ට් ෆැෂන් - වැලිසර**

# සිතක රහස

සිතට පිණි වැටෙන රෑ
අහස් ගඟේ ඈත කොනක
සුසුම්වලට වැඩියෙන් බර
කොපුල් තෙමන කඳුළු පොදක
තරු අහුරක මල් පොකුරක
වැහි බිඳුවක නොවුන්නාට
සිහින පොතේ හැම පිටුවකම
ඔබ ඉන්නවා මේ බලන්න

පෙම් සිතිවිලි හංගාගෙන
කියාගන්න බැරි වුණාට
මං ආසයි හැමතිස්සෙම
ඔබට හොරෙන් ඔබේ
ළඟ ඉන්නට

දුර ඈතක හිත හංගා
නෝක්කාඩු නොවුනාට
ආදර ඇස් දිළිසෙනවා
ඔබට හොරෙන්
මට පේන්න

**ඒ.යූ. සඳුනි දිල්හාරා**
**එසෙන්ෂල්ස් - කහවත්ත**



# මිතු දම

සීගිරිය තරම් උස
පැතුම් මල් එකින් එක
ඒවා වෙන වෙන සුවඳ ගැන
පවසන්න තරමට ළංවුණා ඔබ මට

නියගෙයින් පිපාසිත මහ පොළව
වැසි දියෙන් සනසවන ගුවන් ගැබ
සේම මාගේ ඉරිතැලුණු සිත් බිමට
මිතුදමින් වරුසාව උනා ඔබ මට

කවුරුවත් දන්නේ නැති කතාවක
අපි නේද සෙනෙහෙබර චරිත දෙක
අපි සිතින් ඒ වින්ද මිතු දම
මොනතරම් ලස්සනද අපි අසල

**තේජනි නිකේෂලා**
**ලොන්ජරි**
**වතුපිටිවල**

# දහසක් පැතුම් මල්

එපා දියණියනි
මගේ සිත රිදවන්න
තැලී පොඩිවී
නැගිටින්න වෙර දරන
ජීවිතය
එපා යළිත් ඔබ
සිඳලා දමන්න...

හිතුවක්කාරකම් කළත්
මා පෙර දවස
මා වැදූ දෙමව්පියන් හට
දුන් දුක් කඳුළු මා
එපා යළි යළිත් ඔබ
මට තිළිණ කරන්නට
මගේ ආදර දියණියේ...

දහසකුත් පැතුම් මල්
සිත් දරා සෙනෙහසින්
පිය සෙනෙහස
අහිමි ඔබට
මහමෙරක් විය මා
සදා කල්හිම
එපා සිඳලා දමන්න
මා තනන ලෝකය
මගේ ආදර දියණියේ...

**13389**
**තත්ත්ව පාලන අංශය**
**ෆාස්ට් ෆැෂන්**
**මිනුවන්ගොඩ**



# නුඹ නිසා

පාවයන අපූරුව වළාපෙළ නුඹ ගැබේ
මටත් යන්නට හිතයි ඇත්තටම ඒ වගේ
ඒත් නුඹ සොරාගෙන සැහැල්ලුව මගේ හිතේ
පියාපත් බර වැඩියි නුඹට බැඳි සෙනෙහසේ

**අනූෂා කුමාරි**
**එසෙන්ෂල්ස්**
**කොග්ගල**

# ඈය

විටෙකදී දියණියකි ලොව තුළ මැවූ නුඹ
මව් රැජිණ නුඹමය මෙතුන් ලොව කිරුළුලන
නිසල වුවත් ඔබ පිවිතුරු සුර අඟන
සියුමැලි දෑත වේ සුරලොව සරසවන

සියුමැලි දෑත් එක් කොට තැනූ ඇඟලුමක
දකින්නට හැකිය නුඹෙ විස්කම් යසට
සිහින් නූල් අතරින් දිවෙනා හැඩය
කියාපායි නුඹෙ දිවියේ ඇති ගැහැට

**එස්.ඒ.එන්.එස්. අබේකෝන්**
**එසෙන්ෂල්ස් - රඹුක්කන**

මේ ඔබේ ඉඩයි

# දශකයක් පුරාවට මෙහෙවරට සැදි දියවර



**මීට වසර දහයකට පෙර අපේම බ්‍රැන්ඩික්ස් සාමාජිකයින්ගේ පානීය ජල අවශ්‍යතා සඳහා විසඳුම් සපයමින් අප ඇරඹූ මෙහෙවරට දියවර වැඩසටහන මේ වන විට සිරිලක පුරා ගම්දනව් සිසාරා ගලා යමින් අප සාමාජිකයින් දහස් ගණනකගේ පානීය ජල අවශ්‍යතා සපුරා තිබෙනවා. වසර දහයක් කියන්නේ සුළු පටු කාලයක් නෙවෙයි. ඒ වගේම තමයි ඒ කාලය පුරාවට අප විසින් දියත් කළ ජල ව්‍යාපෘති ප්‍රමාණයත් සුළු පටු නැහැ. එදා මෙම ව්‍යාපෘතිය හරහා ජල අවශ්‍යතා සපුරා ගත් පළමු බ්‍රැන්ඩික්ස් සාමාජිකාව වුණේ රේණුකා. එලෙසින් ඇරඹි ජල ව්‍යාපෘතිවල ප්‍රතිලාභ ලබන්නේ බ්‍රැන්ඩික්ස් සාමාජිකයින් හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් පමණක්ම නෙවෙයි. ඔවුන්ගේ ගම්වැසියන් පවා එම ප්‍රතිලාභයන්හි කොටස්කරුවන් බව අපි කවුරුත් දන්නවා. මෙලෙසින් දිගහැරෙන්නේ ඔබගේ මෙහෙවර වෙනුවෙන් වසර දහයක් පුරාවට අපෙන් සැදුනු දියවරයන් ගැන බිඳක් පමණී.**



මට ලබාදුන් ජල ව්‍යාජෘතිය පිළිබඳව බ්‍රැන්ඩික්ස් ආයතනයට හෘදයාංගම ස්තූතිවන්ත වෙනවා. මේ නිසා තවත් මට මහ රෑට වතුර හොයාගෙන දුර යන්න වෙන්නේ නැහැ. මේ ව්‍යාපෘතියෙන් මා වගේම මගේ අසල්වැසියනුත් ප්‍රතිලාභ ලබනවා. ඔවුනුත් බ්‍රැන්ඩික්ස් වෙත සිය ස්තූතිය පුදකර සිටිනවා. ඒ වගේම, මගේ සේවා කාලය තුළදී බ්‍රැන්ඩික්ස් වෙතින් මෙවන් ප්‍රතිලාභයන් බොහෝමයක් ලබා තිබෙනවා.

**රේණුකා රත්නායක**
**මෙහෙවරට දියවර පළමු ප්‍රතිලාභිනි**

**2007 වසරේ රේණුකාගෙන් ඇරඹි දියවර 2017 වසරේ රසිකලාගෙන්ද නොනැවතී ගලා යනු ඇත.**

*2007* ........ *2017*

මගේ පවුලේ සාමාජිකයින් 6 දෙනෙක් ඉන්නවා. පියා වයෝවෘද තත්ත්වයේ සිටින නිසා මව තමයි කුලීවැඩ කරලා අපිව හැදුවේ. මම මැෂින් ක්‍රියාකරවන්නියක් ලෙසින් මඩකලපුව එසෙන්ෂල්ස් ආයතනය සමඟ සම්බන්ධ වුණේ මීට වසර දෙකකට පෙර.

අප ජීවත් වන ප්‍රදේශයේ පානීය ජලය සපයා ගැනීම හරිම අපහසුයි. ඒ නිසා අපිට කිලෝමීටර 4 ක් විතර දුර යන්න වෙනවා. ඒත් මේ වසරේ මෙහෙවරට දියවර වැඩසටහන යටතේ බ්‍රැන්ඩික්ස් ආයතනය අපට නළ ළිඳක් තනා දුන්නා. ඒ නිසා මගේ පවුලේ සාමාජිකයින්ට වගේම අපේ ගමේ තවත් පවුල් 10 කට වඩා පිරිසකට වතුර ලබාගෙන එදිනෙදා අවශ්‍යතාවයන් සපුරා ගන්න හැකි වුණා. මා ගැන වගේම මගේ ගමේ ජනතාව ගැනත් හිතලා අපට තිබුණු වතුර ප්‍රශ්නය විසඳා දුන්නට බ්‍රැන්ඩික්ස් ආයතනයට මගේ හෘදයාංගම ස්තූතිය පුද කර සිටිනවා.

**පරමලිංගම් රසිකලා**
**එසෙන්ෂල්ස්, මඩකලපුව**





















පුරා වසර දහයක් අපගේ සාමාජික සාමාජිකාවන් මුහුණ දුන් පානීය ජල ගැටලු සඳහා පිළියම් ලබාදීමට අපට හැකි වුණා. එලෙසින් ඔවුන්ට උපකාර වීමට හැකිවීමට ලැබීම අපට ගෞරවයක්. මොකද අපේ ආයතන සමූහයේ ජීවනාලිය වන්නේ එහි සාමාජිකයින් සියලුදෙනා නිසා.

**අනූෂා අලස්**
**සමාජ සත්කාරක සහ ආයතනික සන්නිවේදන ප්‍රධානී**

# සොබාදහම සමඟින් එක්ව යමු

*ජාත්‍යන්තර පරිසර දිනය යෙදී තිබුණේ පසුගිය ජුනි 5 වැනිදාට. ලොව පුරා විවිධාකාරයෙන් පරිසර දිනය සැමරුවත් බ්‍රැන්ඩික්ස් අපට නම් වසරේ සෑම දිනයක්ම පරිසර දිනයක් වගෙයි. ඒ අපි සොබාදහම සමඟින් බද්ධ වුණු ආයතනයක් වන නිසයි. අපගේ ආයතන සමූහය තුළ ක්‍රියාත්මක වන හරිත සංකල්පය එයට හොඳින් සාක්ෂි දරනවා. මේ වසරේ ලෝක පරිසර දින තේමාව වූයේ, "සොබාදහම සමඟින් එක්ව යමු" යන්නයි. පරිසරය සමඟ බැඳී සිටින ආයතනයක් ලෙසින් බ්‍රැන්ඩික්ස් අපට නම් එය මනාව ගැලපෙනවා.*



බ්‍රැන්ඩික්ස් හරිත කර්මාන්තශාලාව, සීදූව




බ්‍රැන්ඩික්ස් අපගේ හරිත සංකල්පය පිළිබඳව අවධානය යොමු කළොත් එය ඉතා පුළුල් ක්ෂේත්‍රයක විහිදෙනවා. පරිසරය සුරැකීම සම්බන්ධයෙන් ආයතනික මට්ටමෙන් විවිධාකාරයේ ක්‍රියාමාර්ගයන් ගන්නා අතරම අපි එයින් බැහැරවූ සමාජයේද විවිධාකාරයේ වැඩසටහන් ඇරඹුවා. ඒ අතර මෑතකදී ආරම්භ කළ කැළණි ගං කොමළිය සුරැකීමේ වැඩසටහන දැක්විය හැකියි.

ඒවගේම, අද වනවිට අප ආයතන සමූහයේ සීදූව හරිත කර්මාන්තශාලාව වගේම රත්මලාන එසෙන්ෂල්ස් ආයතනය, කොග්ගල එසෙන්ෂල්ස් ආයතනය, ගිරිතලේ කැෂුවල්වෙයා(ර්) ආයතනය, වතුපිටිවල ලොන්ජරි ආයතනයත් හරිත සම්මානයන්ගෙන් පිදුම් ලද ආයතනයන්. එපමණක් නෙවෙයි ඉන්දියාවේ පිහිටි අපගේ කර්මාන්තශාලා පරිශ්‍රය මෙන්ම මඩකලපුවේ අලුතෙන් ඉදිකළ එසෙන්ෂල්ස් ආයතනය ක්‍රියාත්මක වෙන්නෙත් හරිත සංකල්පයට අනුවයි.

මිනිසාගේ පැවැත්ම රඳා පවතින්නේ පරිසරය මතයි. එහිදී පරිසරය කියන කුලකය තුළට ගහ කොළ, සතා සිවුපාවා, ජලය වගේම සුළඟත් අයත් වෙනවා. මිනිසාගේ පැවැත්ම උදෙසා පරිසරය තමන් සතු සියලු ධනයම කැපකරනවා කිව්වොත් එය මුසාවක් නෙවෙයි. එය හරියට මවක් තම දූ දරුවන් වෙනුවෙන් මුළු ජීවිතයම කැප කරනවා වගෙයි. මිනිසාට ජීවත්වීමට අවැසි සියලු සම්පත් නිර්ලෝභීව සපයන පරිසරයට

## වායු ගෝලය

| | |
|---|---|
| අහිතකර වායු විමෝචනය අඩු කිරීම | 16.8% |
| පුනර්ජනනීය බලශක්තිය භාවිතය | 23.0% |
| වාර්ෂිකව ඉතිරි කළ දැව ඉන්ධන ප්‍රමාණය | 2.9 ML |
| වාර්ෂිකව උත්පාදන කරනු ලබන සූර්යය බලශක්තිය | 453 MWh |

මිනිසාගෙන් මොනවද කෙරෙන්නේ? ඔබ ඒ ගැන සිතා තිබෙනවාද? මේ අවශ්‍යතාවය වටහාගත් නිසාම තමයි බ්‍රැන්ඩික්ස් අපි අපගේ මූලික වගකීමක් යුතුකමක් ලෙසින් පරිසරය රැකගැනීම සඳහා කටයුතු කරන්නේ. ඒ සඳහා අප තැබූ පියවර ලෙස ආයතන මට්ටමින් විවිධාකාර වැඩසටහන් දියත් කළා. ඒ පිළිබඳව වියමන් වෙතින් තොරතුරුත් ගෙන ආවා. එම වැඩසටහන් අතර ඉවතලන ආහාර ප්‍රමාණය අවම කිරීමේ වැඩසටහන, කඩදාසි භාවිතය අවම කිරීමේ වැඩසටහන, ප්ලාස්ටික් බෝතල් භාවිතය නතර කිරීමේ වැඩසටහන වැනි වැඩසටහන් තවමත් සාර්ථක ලෙසින් අපගේ ආයතනවල සිදුවෙනවා. එලෙසින් නාමිකව හැඳින්වුවද සොබාදහම සුරැකීම සඳහා අප විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතියට මෙම රූප සටහනුත් සාක්ෂි දරනු ඇත.

අද වන විට පරිසර දූෂණය ව්‍යසනයක් බවට පත්වෙලා. එයට හොඳම උදාහරණය ලෙසින් මීට මාස කිහිපයකට පෙර ඇති වූ මීතොටමුල්ල කුණු ප්‍රශ්නය දැක්විය හැකියි. ඒ ප්‍රශ්නයත් සමඟින් කුණු කන්දකට යටවී මිනිස් ජීවිත හානි වූ රටක් ලෙසින් අපි ලෝක ඉතිහාසයටත් එක්වුණා. එපමණක් නෙවෙයි පසුගියදා ඇදහැලුණු ධාරානිපාත වර්ෂාවත් සමඟින් මෙරට ඇති වූ ජල ගැලීම් තත්ත්වය සහ නාය යෑම් හේතුවෙන් විශාල ජීවිත ප්‍රමාණයක් හානියට පත්වුණේ එවන් ස්වභාවික ව්‍යසනයක් හේතුවෙන් අහිමිවූ වැඩිම ජීවිත ප්‍රමාණය පිළිබඳවද වාර්තාවක් පිහිටුවමිනුයි. මේ ව්‍යසනයන් සියල්ලටම හේතු වී ඇත්තේ මිනිසා විසින් අති විශාල ලෙසින් සිදුකරනු ලබන පරිසර විනාශයයි. තවදුරටත් ඇස් කන් වසාගෙන මේ සිදුවන ව්‍යසනය දෙස බලා සිටිනවාට වඩා එය වලක්වාගැනීම සඳහා කටයුතු කිරීමට මිනිසාට තවමත් අවස්ථාව තිබෙනවා.

මිනිසා විසින් සිදුකරන මේ විනාශය අවම කිරීම සඳහා අපි පසුගියදා තවත් පියවර කිහිපයක් ගනු ලැබුවා. එහිදී පොලිතීන් බෑග් භාවිතය නතරකිරීමේ ක්‍රියාන්විතය දැක්විය හැකියි. ඒ සඳහා අපි අපගේ ආයතනය පරිශ්‍රයන් පොලිතීන්වලින් තොර පරිසර බවට පත්කිරීම සඳහා පොලිතීන් වෙනුවට ප්‍රතිචක්‍රීකරණය කරන ලද බෑග් භාවිතය හඳුන්වාදීමට කටයුතු කළ අතර එය මේ ජූලි පළමුවැනිදා වැලිසර ෆාස්ට් ෆැෂන් පරිශ්‍රයෙන් ආරම්භ වුණා. එපමණක් නෙවෙයි ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය කිරීමේ වැඩසටහනකුත් ආරම්භ කරලා තියෙනවා. ආරම්භයක් වශයෙන් මේ වනවිටත් පර්ෂද මූලස්ථානවල මෙන්ම බ්‍රැන්ඩික්ස් ලංකා හි රථ ගාල්වල ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීමට විශාල බඳුන් ස්ථානගත කර තිබෙනවා. ඒවාට ප්ලාස්ටික් අපද්‍රව්‍ය නිසි ලෙසින් බැහැර කළ යුතු ආකාරය පිළිබඳව සාමාජික ඔබ දැනුවත් කිරීම් ඉදිරියේදී සිදු කෙරෙවී. එලෙසින් ප්‍රතිචක්‍රීකරණය සඳහා බැහැර කළ හැකිවන්නේ ප්ලාස්ටික් පමණක් වන අතර එසේ බැහැර කිරීමට පෙර ඒවා සෝදා පිරිසිදු කිරීම අනිවාර්යයි. මෙම වැඩසටහන් ඉතා කෙටි කාලයක් තුළදී අපගේ සමූහය පුරාම ව්‍යාප්ත වෙනු ඇත.

මෙලෙසින් පරිසරය සුරැකීම සම්බන්ධයෙන් අපි ආයතන මට්ටමෙන් පියවර ගන්නා අතරේ සමාජයට වගකිවයුතු පුද්ගලයෙක් ලෙසින් ඔබටත් මේ පණිවිඩය සමාජ ගත කිරීමට හැකියාව තිබෙනවා. හතලිස් අට දහසකට ආසන්න වූ සාමාජික ඔබ සියලුදෙනා පරිසරය සුරැකීමේ පණිවිඩය සමාජයට ගෙන යා හැකි නම් පරිසරය සුරැකීමේ මෙහෙවර ඉතාමත් ඉක්මනින් සමාජ ගත කිරීමට අපට හැකිවේවි.

## භූමිය

| | |
|---|---|
| අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම | 49.0% |
| පොළවට අපද්‍රව්‍ය දැමීමෙන් වැළකීම | 96.8% |
| එක් ආහාර වේලකදී අවම කරන ලද ඉවතලන ආහාර ප්‍රමාණය | 10.8% |

# සත්වන වරටත් සත්කාරයේ සඳ නම බැබළෙයි

බ්‍රැන්ඩික්ස් අපි කවදත් සමාජයට හිතැතියි. ඒ නිසාම සමාජ සේවා මෙහෙයන්වලදි අපි හැමදාමත් පෙරමුණ ගන්නවා. එලෙසින් අප විසින් ඉටු කරන සමාජ මෙහෙයන් ලැයිස්තු ගත කළොත් වාර්ෂික ලේ දන්දීමේ වැඩසටහන එම ලැයිස්තුවේ ඉහළින්ම පවතිනවා. ඒ නිසාම තමයි අපි මේ වනවිට ජාතික රුධිර පාරවිලනය සේවාවේ යාව ජීව දායකයෙක් බවට පත්වී තිබෙන්නෙත්.

අප ආයතන සමූහය වාර්ෂිකව සිදුකරනු ලබන රුධිර පරිත්‍යාග කිරීමේ වැඩසටහනේ ප්‍රධානතම දායකයින් වන ඔබට එම වැඩසටහන පිළිබඳව අමුතුවෙන් හඳුන්වාදීමක් අවශ්‍ය නොවුනත් එම සද්කාර්යයට ලැබෙන ගරුබුහුමන් පිළිබඳව නම් ඔබට දැන්විය යුතුමයි. ඒ, සෑම බුහුමනකම සැබෑ හිමිකරුවන් වන්නේ හතලිස් අට දහසක් පමණ වන සාමාජික ඔබ සියලුදෙනා වන නිසායි.

2016-17 වසර සඳහා ආයතන මට්ටමින් අතිසාර්ථක අයුරින් සිදුකරන ලද රුධිර පරිත්‍යාග කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් පසුගියදා අපි සම්මානයට පාත්‍ර වුණා. ඒ, ජාතික රුධිර පාරවිලයන සේවයට රුධිර ඒකක 4,090 ක් පරිත්‍යාග කිරීමත් සමඟම අඛණ්ඩව හත් වන වසර සඳහාත් මෙරට පුද්ගලික අංශයේ විශාලතම රුධිර දායකයා ලෙසිනුයි. එමෙන්ම මෙම වසරේ අප සමූහය ජාතික රුධිර පාරවිලයන සේවයට පරිත්‍යාග කළ රුධිර ඒකක ප්‍රමාණය වසරක් තුළදී ප්‍රදානය කළ වැඩිම රුධිර ඒකක ප්‍රමාණය ලෙසිනුත් බ්‍රැන්ඩික්ස් ඉතිහාසයට එක් වෙනවා. දිවයින පුරා විහිදි බ්‍රැන්ඩික්ස් කර්මාන්තශාලා 27 ක් තුළදි එකතු කළ මෙම රුධිර ඒකක ප්‍රමාණයත් සමඟින් බ්‍රැන්ඩික්ස් සමූහය පසුගිය වසර 10 ක කාලය තුළදී රුධිර ඒකක 24,513 ක් ජාතික රුධිර පාරවිලයන සේවයට පරිත්‍යාග කර තිබෙනවා.

අවසන් වූ වසරේදී බ්‍රැන්ඩික්ස් කර්මාන්තශාලා අතරින් වැඩිම රුධිර ඒකක ප්‍රමාණයක් පරිත්‍යාග කළ කර්මාන්තශාලා ලෙසින් රුධිර ඒකක 448 ක් පරිත්‍යාග කළ වතුපිටිවල ලොන්ජරි ආයතනය, රුධිර ඒකක 356 ක් පරිත්‍යාග කළ කොග්ගල එසෙන්ෂල්ස් ආයතනය, රුධිර ඒකක 333 ක් පරිත්‍යාග කළ පොළොන්නරුව ඇත්ලෙෂර් ආයතනය ඉදිරියෙන්ම සිටිනවා. එපමණක් නෙවෙයි මේ සද්කාර්යය සඳහා දායකවුණු ආයතන 27 න් 17 ක්ම තනි තනි වශයෙන් ගත් කළ රුධිර ඒකක 100 කට වඩා වැඩි ප්‍රමාණයක් පරිත්‍යාග කර තිබෙන බවද දන්වන්නේ අපගේ සාමාජික ඔබ පිළිබඳව ඇතිවන නිහතමානී ආඩම්බරයකිනුයි.



*ජාතික රුධිර පාරවිලයන සේවයේ ජ්‍යෙෂ්ඨ උපදේශක වෛද්‍ය සෙනරත් ජයසේකර මහතා වෙතින් විශේෂ සමරු ඵලකය පිළිගන්නා බ්‍රැන්ඩික්ස් සමූහයේ ප්‍රධාන මානව සම්පත් නිලධාරී ඉෂාන් දන්තනාරායන මහතා ඇතුළු පිරිස*

ජව සම්පන්න බ්‍රැන්ඩික්ස් සාමාජික ඔබගේ නොමසුරු දායකත්වය නිසා වාර්ෂිකව සිදුකරන මෙම උතුම් සද්ක්‍රියාව හේතුවෙන් රෝගී ජීවිත දහස් ගණනකට නැවත ජීවය දෙන්නට අපට හැකිවී තිබෙනවා. ජීවිතයක් රැකගන්නවා කියන්නේ ඒ රෝගියාට පමණක් නෙවෙයි රෝගියාගේ පවුලේ සාමාජිකයින්ටද ජීවිතය පිළිබඳව බලාපොරොත්තුවක්, සතුටක් ඇති කිරීමක්. ඉතින් එවන් දහස් ගණනක් පිරිසකගේ මුවඟ සිනවට හේතුව වූ ඔබ සියලුදෙනාටම වියමන් අපගේ ස්තූතිය පිරිනමන අතර මෙම මාහැඟි ක්‍රියාන්විතය ඉදිරියටත් සිදුකරගෙන යාමට අපට හැකිවේවායි ප්‍රාර්ථනා කරමු.

# මනුසත් බවට වටිනාකමක් එක් කළ මොහොතක්

දින කීපයක් පුරාවට වියරුව ගිය ජල කඳ මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් අහිමි කරද්දී ලක්ෂ ගණනක මිනිසුන්ට ජීවිත කාලය පුරාම එකතු කර ගත් හැමදේම අහිමිව ගියේය. එලෙසින් කිසිදු පිළිසරණක් නොමැතිව අසරණ වූ තවත් මිනිසුන් කොටසක් වෙනුවෙන් උපකාර අවශ්‍යම වූ මොහොතකදී මනුෂ්‍යත්වයේ දෑත් දිගු කරන්නට බ්‍රැන්ඩික්ස් පවුලේ සැමට අවස්ථාව උදා වුණි.

ඉතා කෙටි කාලයක් තුළ කළ හැකි යමක් වෙනුවෙන් එක් වන්නට යැයි කළ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් බ්‍රැන්ඩික්ස් සමූහයේ ආයතනවල සාමාජික සාමාජිකාවන් එකම පවුලක් ලෙසින් අත් වැල් බැඳගත්හ.

ඒ අනුව නාය යෑම් සහ ගංවතුර හේතුවෙන් අසරණ වූ මිනිසුන් සහ දරුවන් වෙනුවෙන් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය එකතු කිරීම සඳහා අප ආයතනවල සාමාජිකයින්ගේ සහ කළමනාකාරීවයේ උපකාරයන් නොමසුරුව ලැබුණි. ඇත්තෙන්ම අප නොසිතූ තරම් ආධාර ප්‍රමාණයක් අප වෙත ලැබුණු අතර ආයතනවල මූලිකත්වයෙන් එක්රැස්වූ භාණ්ඩ බෙදා හැරීමට එම ආයතන කටයුතු කරනු ලැබීය.

මෙසේ බ්‍රැන්ඩික්ස් ඒකල, සීදූව සහ ගිරිතලේ ආයතනවල සාමාජිකයන්ගේ සහ කළමනාකාරීත්වයේ උපකාරයෙන් එකතු වූ භාණ්ඩ ඉහළ අතුරලිය ප්‍රදේශයේ ගොමදියවල ගම්මානයේ පීඩාවට පත් පවුල් 100 කට පමණ සහ පරදුව ග්‍රාමයේ තවත් පවුල් 60 කට පමණ ලබා දුන් අතර එහි සිටි පිරිස එය ජීවිතයේ මිල කළ නොහැකි දෙයක් ලෙසින් භාර ගනිද්දී හදවතට දැනුන සතුට වචනයෙන් විස්තර කළ නොහැකි තරම්ය.

එසේම වතුපිටිවල සහ බියගම ලොන්ජරි පර්ෂදයේ සාමාජික සාමාජිකාවන් සහ කළමනාකාරීත්වයේ උපකාරයෙන් එක්රැස් කරගත් භාණ්ඩ බියගම සහ හොරණ අවට පිරිස් මෙන්ම අම්තිරිගල, අවිස්සාවේල්ල ප්‍රදේශයන්හි පීඩාවට පත් අප සහෝදර සාමාජික සාමාජිකාවන්ට මෙන්ම අවට පිරිස වෙත බෙදා දෙනු ලැබිණ.











මෙවන් ආකාරයට බ්‍රැන්ඩික්ස් සමූහයේ බොහෝමයක් ආයතන එකට එක්ව සහ තනි තනිව අප සහෝදර සහෝදරියන් වෙනුවෙන් තම තමන්ට හැකි අයුරින් උදව් උපකාර කිරීමට ඉදිරිපත් වීමෙන්ම පෙනී යන්නේ අනුන්ගේ දුක හඳුනන මෙන්ම අත්‍යාවශ්‍ය මොහොතේදී නිසි අයුරින් ක්‍රියාත්මක වන සංවේදී හදවත් ඇත්තවුන්ගේ අප පොහොසත් බවය.

මිනිසුන් වශයෙන් ඉපිද මිනිසත්කම ලැබූ අප, අසරණ වූ අපේම මිනිසුන් වෙනුවෙන් මෙසේ එක පවුලක් ලෙසින් එකතුවී අපට හැකි අයුරින් ඔවුන්ට උපකාර කිරීමට හැකිවීම බ්‍රැන්ඩික්ස් සාමාජිකයින් ලෙසින් අපට සැබෑවටම ආඩම්බරයට කරුණකි.



# ඔවුන් ඇත අප එන තුරු මග බලා - තුන්වන අදියර



මෙවරත් සුපුරුදු ලෙසින්ම මීරිගම ෆාස්ට් ෆැෂන් 2 ආයතනයේ අපි අපගේ තෙමඟුලට අරුතක් වැඩසටහන දියත් කළෙමු. ඒ අනුව පවුල් 15 කට පමණ වියළි ආහාර ද්‍රව්‍ය බෙදාදීමට තීරණය කළෙමු.

මෙවර අපි ප්‍රථමයෙන් අප ආයතනයේ සාමාජික සාමාජිකාවන්ගෙන් ඔවුන්ගේ ප්‍රදේශවල සිටින රැකියාවක් කරගත නොහැකි අසරණ අය සිටී නම් ඔවුන්ගේ තොරතුරු ලබාදෙන ලෙසින් දන්වා සිටියෙමු. ඒ අනුව එවැනි අය පිළිබඳව තොරතුරු රාශියක් ලැබිණි. ඒ සමඟින් ක්‍රියාමක වුණු අපි එම පිරිස අතරින් පවුල් 15 ක් තෝරා ගත් අතර ඒ එක් එක් පවුල සඳහා රුපියල් හාරදහසක් පමණ වටිනාකමකින් යුත් වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීමට තීරණය කළෙමු. ඒ සඳහා අප ආයතනයේ සාමාජික සාමාජිකාවන්ගේ මූල්‍යමය මෙන්ම ද්‍රව්‍යමය සහභාගීත්වය ලැබුණි.

එලෙස එකතු කළ ද්‍රව්‍ය ඔවුන් වෙත ගෙන ගොස් භාරදීමද සිදුවූයේ අප ආයතන සාමාජික සාමාජිකාවන්ගේ අතිනි. මෙවරද අප දෙසවන්වලට දුක්බර කතා රාශියක් අසන්නට ලැබුණු අතර දෙනෙත් කඳුළින් තෙත් කරවන ආකාරයේ දසුන්ද නෙතු ගැටුණි. මෙම කඳුළු කතා ගණනාවකම කතා නායකයින් වන්නේ දුක් මහන්සියෙන් දරුවන් හැදූ වැඩූ මව්පියන් වීම හද කම්පා කරවන්නකි. එලෙසින් තමන් හැදූ වැඩූ මව්පියන්ව තනිකර දමායන්නට තරම් දරුවන් මෙසේ නපුරු වන්නේ කුමක් නිසාදැයි යන්න අපට තවමත් ගැටලුවකි.

කඳුළු කතා ගණනාවක් මැදින් ඔවුන්ගේ මුවඟට මොහොතකට හෝ සිනහවක් ගෙන ඒමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයකි. ඒ අසරණ මිනිසුන්ගේ අව්‍යාජ සිනාවන්, තුති පිදීම් හා පිළිගැනීම් ඇත්තෙන්ම අපගේ දෙනෙත් කඳුළින් බොඳ කරන්නට සමත්වූ බව නම් සඳහන් කළ යුතුමය.

**එච්.කේ.එල්. කසුනි**
**මානව සම්පත් අංශය, ෆාස්ට් ෆැෂන් 2 - මීරිගම**

# ළමා මුවඟට සිනහවක් ගෙන ආවෙමු

එලෙසින් මීරිගම ආයතන සාමාජික සාමාජිකාවන් සද් කාර්යයක නිරතවද්දී ඒ හා සමානම සද් කාර්යයක නිරතවීමට වැලිසර ෆාස්ට් ෆැෂන් ආයතන සාමාජික සාමාජිකාවන්ටත් හැකි වුණා. ඒ වැලිසර පරාක්‍රම ළමා නිවාසයේ දරුවන් සිය ආයතනයට ගෙන්වා සියලු කණ්ඩායම්වල සාමාජිකයින්ගේ එකතුවෙන් එම දරුවන්ට සංග්‍රහ කර එම ළමා නිවාසයට ආධාර පිරිනමමිනුයි. පරාක්‍රම ළමා නිවාසයේ දරුවන් කියන්නේ වැලිසර ආයතන සාමාජිකයින්ට නුහුරු පිරිසක් නම් නෙවෙයි. එයට හේතුව වන්නේ වැලිසර ආයතනය නිරන්තරයෙන්ම එම ළමා නිවාසය සමඟින් සම්බන්ධ වෙමින් ඔවුන්ගේ ඕනෑ එපාකම් සඳහා උපකාර කරන බැවිණුයි.



# කවි පත්තරේ



## සම්බුදු තෙමඟුල

*සරා සංකප්කල් පෙරුම් දම් පුරා*
*බුදු බව පතමින් සසර සැරි සරා*
*ලෞකික සැමදේ අතිර බව කියා*
*පසක් කළා හිමි බුදු බව පතලා*

*පස්මහ බැලුම් බලලා බෝසත් සමිඳු*
*කුස පිළිසිඳුනා මායා දේවිගේ තුරුණු*
*පුන් සඳ නැග එද්දි වෙසඟේ සිරි පිරුණු*
*සල් උයනේදි ඉපදුණි බුදු පුත් කුලුණු*

*අනෝම ගං තෙරදී හිස මුඩු කර සොඳිනේ*
*බුදු බව පතන්නට පාරමී පිරූ සමිදේ*
*ඥාණ වඩා සිත එක්තැන් කර නිතිනේ*
*බුදු බව ලැබුවා වෙසඟේ හිමි බෝ සෙවණේ*

*මනුලෝ සතුන් විඳිනා බව දුක දැකලා*
*කරුණා දයා ගුණයෙන් මෙත් සිත් පාලා*
*උතුම් නිවන් මග යන්නට දහම් දෙසලා*
*සසර ගමන කෙටිකර ලොව එළිය කළා*

*මේඝ වළාවන් අහසේ පා වෙද්දී*
*උපවත්තන උයනේ සල්මල් පර වෙද්දී*
*තුන් ලෝකයටම දුක් සුසුමන් බර වෙද්දී*
*පිරිනිවනට වැඩි බුදුහිමි භව දුකින් මිදී*

රේකා කුමාරි මදරසිංහ
එසෙන්ෂල්ස්
කොග්ගල

හොඳම නිර්මාණය සඳහා නිර්දේශිතයි

2017 අගෝස්තු මස 04 වන දිනට පෙර මෙවර කලාපයේ පළ වූ ප්‍රහේලිකාව පුරවා මානව සම්පත් අංශය වෙත භාර දෙන්න. නිවැරදි විසඳුම් එවන ජයග්‍රාහකයින් තිදෙනෙකුට බ්‍රැන්ඩික්ස් සමරු තිළිණ හිමි කරගැනීමේ අවස්ථාව උදා වේ.

නම:..............................................................
..................................................................

සේවා අංකය:...................................................
ආයතනයේ නම:................................................
..................................................................

**ප්‍රහේලිකාව නිවැරදිව පුරවා එවන ජයග්‍රාහකයින් තිදෙනෙකුට වියමන් සඟරාවෙන් සමරු ත්‍යාග හිමි වේ.**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කා | | | ර | | | | ඔ |
| | | න් | | ප | ත් | ති | නි | | ට් |
| | | තා | | | | | වි | | ට |
| සී | දු | ව | | | | | ති | | පා |
| | | න් | | | | | ග | | ලු |
| | | | | | | | ල | | |
| | | | නි | වේ | ද | න | | | |
| | | | ව | | | | | | |
| | | | හ | | | වැ | හි | ලේ | නි |
| පො | ළො | න් | න | රු | ව | | | | |

**ප්‍රෙහේලිකා පුරවා ජයග්‍රහණය ලැබුවෝ**

**ඒ.පී. රොෂාන් සංජීව**
කැෂුවල්වෙයා(ර්) - රත්මලාන

**කමලානි ආටිගල**
ලොන්ජරි - වතුපිටිවල

**පී.ඩී. සඳුනි නිසංසලා සේනාරත්න**
ෆාස්ට් ෆැෂන් - වැලිසර

# හිතට හොරා



ඒදා ආයතනයේ මානව සම්පත් අංශය වෙනදටත් වඩා කලබලයි. ඒ, ආයතනය මගින් පවත්වන පද්‍ය නිර්මාණ තරගය සඳහා ඉදිරිපත්වී ඇති නිර්මාණයන් අතරින් හොඳම නිර්මාණ කිහිපය තෝරා ගැනීමේ භාරදූර කටයුත්ත සිදුවෙන නිසා. ඉදිරිපත් වී ඇති කාව්‍ය සහ ගීත නිර්මාණ අතරින් හොඳම නිර්මාණය සෙවීමත් හරියට කිරෙන් දිය වෙන්කරනවා වගේ අසීරු කාර්යයක් වෙලා. ඒ නිසාම නිර්මාණ විනිශ්චය කරමින් සිටි විනිසුරු මඬුල්ලත් සුපරීක්ෂාකාරී මෙහෙයුමක.

ඒ අතරේ, "ආ... මෙන්න තියෙනවා ලස්සන නිර්මාණයක්. නිර්මාණය වගේම ලියලා තියෙන අත් අකුරුත් හරි කලාත්මකයි. ම්ම්ම්... කවුද බලමු මේක එවලා තියෙන්නේ..... ආ.... කවීන්ද්‍ර නිර්මාණ. හැකියාවටම ගැලපෙන නමක්." විනිසුරු මණ්ඩල සාමාජිකයාගේ ඒ ප්‍රකාශයෙන් සියලු දෙනාගේම අවධාන ඒ වෙත යොමු වුණා. ඉදිරිපත් වෙලා තිබුණු නිර්මාණ සිය ගණන අතරින් කවීන්ද්‍රගේ නිර්මාණය සියලු දෙනාගේම ඒකමතික තීරණයෙන් පළමු ස්ථානයට තේරුණේ ඒ විදියට. ඒ විතරක් නෙවෙයි ආයතනයේ මාධ්‍ය අංශය මගින් ඒ මොහොතේම ඔහුගේ ජයග්‍රහණය පිළිබඳව සියලු දෙනාටම දැන්වූයේ පළමු ස්ථානය සඳහා ලබාදෙන ත්‍යාගය පිළිබඳවත් සඳහන් කරමිනුයි.

මැෂින් ක්‍රියාකරුවෙක් ලෙසින් කටයුතු කරන කවීන්ද්‍ර, ඔහුගේ ආයතනය තුළ තරමක් ජනප්‍රිය චරිතයක්. ඒ ඔහු විසින් ලියන පද්‍ය නිර්මාණයන් ආයතනයේ බිත්ති පුවත්පතේ මෙන්ම අන්තර් ආයතනික මාසික සඟරාවේද නිරන්තරයෙන් පළ වන නිසයි.

දිවා ආහාර වෙලාවේදී ඔහු හමුවීමට පැමිණි සාමාජික සාමාජිකාවන් බොහෝ දෙනෙක් සුබපැතුම් එක් කළා. "අපි නම් දැනගෙන හිටියා අයියා පළවෙනියා වෙයි කියලා." ඔහු වෙත පැමිණි සමහර තරුණියන් පවසා සිටියා. සුබ පතමින් සිටි තරුණ තරුණියන් වටකරගත් කවීන්ද්‍ර වෙතින් දක්නට ලැබුණේ පුංචි ආඩම්බරයක් මුසු වුණ ජයග්‍රාහී සිනාවක්. ඔහුගේ මේ ජයග්‍රහණයත් සමඟින් ඔහු වෙත තිබුණු ගැහැණු ළමුන්ගේ ආකර්ෂණය තව තවත් වැඩිවුණා.

***මේ ජයග්‍රහණයත් සමඟින් ඔහු වෙත තිබුණු ගැහැණු ළමුන්ගේ ආකර්ෂණය තව තවත් වැඩිවුණා.***

මේ අතර අන්තර් ආයතන මගින් පවත්වන විශේෂ සාහිත්‍ය උළෙලකදී කවීන්ද්‍රව ඇගයීමට සියලු කටයුතු සූදානම් වුණා. උත්සවයේ කටයුතු එලෙසින් සංවිධානය වෙද්දී ආයතන සාමාජිකයින්ගේ ලේඛන හැකියාවන් එළිදැක්වීම සඳහා නිකුත් කරන අන්තර් ආයතනික මාසික සඟරාව සඳහාත් කවීන්ද්‍රගේ මේ ජයග්‍රාහී නිර්මාණය යොමු කරන්න මානව සම්පත් අංශය කටයුතු කළා.

සඟරාව සඳහා යොමු කර තිබූ නිර්මාණ කියවමින් සිටි කතු මඬුල්ල වෙත ඉදිරිපත් වුණේ කවීන්ද්‍රගේ නිර්මාණය. කාටත් ඇසෙන සේ නිර්මාණ කියවමින් සිටි කතෘ මණ්ඩල සාමාජිකයා අත් අකුරුවලින්ම එම නිර්මාණය හඳුනා ගත්තා. "අදත් කවීන්ද්‍රගෙන් හොඳ නිර්මාණයක් ඇවිත් වගෙයි. කියවලා බලමු... ආ.. මේ නිර්මාණය ආයතනයෙන් පවත්වපු පද්‍ය නිර්මාණ තරගයකිනුත් පළවෙනි තැනට තේරිලා කියලත් සහතික කරලා තියෙනවා."

වෙනදා වගේම ඒ නිර්මාණයත් සඟරාවේ පළ කළ හැකි ඉහළ මට්ටමේ පැවතුනු නිසා එම නිර්මාණය පළ කිරීමට කතු මඬුල්ල තෝරා ගත්තා.

මේ අතර එක් දිනක් මුහුණු පොතේ සැරිසරමින් සිටි කතෘ මණ්ඩල සාමාජිකයෙකුගේ නෙත ගැටුණේ තරමක් සුපුරුදු නිර්මාණයක්. ඒ නිසාම ඒ පිළිබඳව අනෙකුත් සාමාජිකයින්ගේ අවධානය යොමුකරන්න ඔහු හිතුවා.

"මේ නිර්මාණය මම FB එකේ දැක්කේ. මේක අපේ සඟරාවට ඉදිරිපත් කරපු නිර්මාණයක් කියලා මට හොඳටම විශ්වාසයි. පොඩ්ඩක් කියවලා බලන්න."

" ආ මේ තියෙන්නේ... මේ අර ආයතනයෙන් කරපු පද්‍ය රචනා තරගයෙන් දිනපු කවීන්ද්‍රගේ නිර්මාණෙමනේ. FB එකෙ තියෙන්නෙත් කවීන්ද්‍රගේ නමින්මද?"

"නෑ.. නෑ... FB එකේ තියෙන්නේ වෙන නමක්."

"එහෙනම් මේ කෙනා කවීන්ද්‍රගේ නිර්මාණේ හොරකම් කරලද දන්නෑ.. මේක නම් හරි කැත වැඩක් කාගේ වුණත් නිර්මාණයක් වංචා කරනවා කියන්නේ... අපි පොඩ්ඩක් මේ ගැන හොයලා බලමු."

කවීන්ද්‍රගේ නිර්මාණය පිළිබඳව ඇතිවූ එම සාකච්ඡාවත් සමඟින්ම මුහුණු පොතේ නිර්මාණය පළ කළ පුද්ගලයා පිළිබඳව වැඩි දුරටත් තොරතුරු හොයන්න කතෘ මණ්ඩලය හිතුවා. "ආ... මේ කෙනත් කවි ලියන කෙනෙක් වගෙයි. එයාගේ wall එකේ මේ විදියේ කවි ගොඩක් share කරලා තියෙනවා. පොඩ්ඩක් ඉන්න බලන්න. මෙතන අපි මීට කලින් සාකච්ඡා කරපු කවියකුත් තියෙනවා වගෙයි. ආ... ඔව් නේ.. ගිය මාසේ සඟරාවට කවීන්ද්‍ර එවපු කවිය. හ්ම්ම්... මේ ගැන නම් හොඳට හොයන්න වෙනවා."

පසුගිය කලාප කිහිපය සඳහාම කවීන්ද්‍ර ඉදිරිපත් කළ කවි සියල්ලම වාගේ මුහුණු පොතෙහි දක්නට ලැබුණේ එම පුද්ගලයාගේ නමිනි. මේ පිළිබඳව අදාළ ආයතනයට දැන්වීම සුදුස බව කතෘ මණ්ඩලය තීරණය කළා. ඒ සමඟින් ක්‍රියාත්මක වුණු ආයතනය වැඩිදුර තොරතුරු සෙවීමේදී කවීන්ද්‍ර විසින් එම නිර්මාණ වංචාව සිදු කර ඇති බව සොයාගැනීමට හැකි වුණා. ඒ අනුව කවීන්ද්‍රගේ ජයග්‍රහණය අවලංගු කළ බව නිවේදන කරනු ලැබුවා.

මේ හදිසි නිවේදනයත් සමඟින් කලබල වුණු කවීන්ද්‍ර මානව සම්පත් අංශය වෙත දිව ගියේ ඒ පිළිබඳව විමසීමටයි. "මිස් මගේ ජයග්‍රහණය කැන්සල් කරේ ඇයි දන්නෑ නේද?" කලබලය මුසුවූ කෝපාවිශ්ට හඬකින් විමසන්නට වුණා.

"ආ.. කවීන්ද්‍ර ආව එක හොඳයි. අපි මේ කවීන්ද්‍රට එන්න කියන්න තමයි හිටියේ. කවීන්ද්‍ර අපිට එවන නිර්මාණ ඇත්තටම ලියන්නේ කවුද?"


තරමක් තිගැස්සුන නමුත් ඒ බව නොපෙන්නාම, "ඇයි මිස් එහෙම ඇහුවේ? මමම තමයි ලියන්නේ." කවීන්ද්‍රගේ පිළිතුර වුණා.

එහෙත් ඒ පිළිතුර ලබාදුන් ස්වරයෙත් ඔහුගේ මුහුණේත් වූ වරදකාරී ස්වභාවය නිසාම "ඇත්ත කියන්න කවීන්ද්‍ර... අපි ඔක්කොම දැනගෙනයි අහන්නේ."

"මට සමාවෙන්න මිස්... ඇත්තටම ඒවා මම තනියම ලියපු කවි නෙවෙයි. මම තව යාලුවෙක් එක්ක එකතුවෙලා ලියපු කවි වගයක්."

"ඇයි කවීන්ද්‍ර ඒ වගේ දෙයක් කරන්න හිතුවේ? නිර්මාණයක් හොරකම් කරනවා කියන්නේ කොයි තරම් නම් වංචාවක්ද? අනිත් එක නිර්මාණයක් හොරකම් කරන්න පුළුවන්. ඒත් කෙනෙක්ගේ හැකියාවක් කවදාවත් හොරෙන් ගන්න බෑ. එහෙම වංචාවක් කරලා ලබන ජනප්‍රියත්වයත් හරිම තාවකාලිකයි."

ඇත්ත සම්පූර්ණයෙන්ම හෙළි නොකලත්, තමන් සිදුකළේ බරපතල වරදක් බව ඒ වන විටත් කවීන්ද්‍රට තේරුම්යමින් තිබුණා. ඒ නිසාම ඇතිවූ ලැජ්ජාවත් සමඟින් ඔහු මානව සම්පත් අංශයෙන් පිටවූයේ ඇස අගට එක්වූ කඳුළු කැටයක් කාටත් හොරෙන් පිසදමමින්මයි.



**පහළට**

1 ගමේ කොයි කවුරුත් තෙල් බෙහෙත් කරගන්න යන්නේ කවුරුන් ළඟටද? (4 පිටුව)

3 පණු කුරුල්ලාගේ පිහාටුවල වර්ණය (15 පිටුව)

5 හරිත සම්මාන ලද ආයතනයකි (10-11 පිටු)

7 කිරිල්ලිය මුණගැසෙන්නට ගියේ කවුරුන්වද? (16 පිටුව)

9 ලොන්ජරි ආයතනයෙන් ආධාර ලබාදුන් ප්‍රදේශයකි (12 පිටුව)

**හරහට**

2 කොළඹ නගරයේ පිහිටි තෙත් කලාප උද්‍යානයකි (18 පිටුව)

4 පාසල් අධ්‍යාපනය ඉහළ පන්තියට පමණක් සීමා වුණු රටකි (18 පිටුව)

6 මෙහෙවරට දියවර වැඩසටහනේ පළමු ප්‍රතිලාභිනිය (9 පිටුව)

8 "චන්ද්‍ර මණ්ඩලේ" ගීතයේ පද රචකයා (17 පිටුව)

10 මේ වසරේ වැඩිම රුධිර ඒකක ප්‍රමාණයක් පරිත්‍යාග කළ ආයතනයකි (12 පිටුව)

## ප්‍රේමය සම්මුතය සහ යථාර්ථය

පෙර දිනක මාවතේ
පිඬු සිඟා වඩිද්දී
මගෙ දෙපා නතරවින
නුඹ පැලේ සිටිද්දී...

බුදුන් දැක නිවන් දැක
එතෙර වන ගමනේ
බුදුට පෙර නුඹෙ රුවය
මගේ නෙත ගැටුණේ...

දෑතේ රැඳි බත් මිටක්
දන් පතට පිදුණේ
දෑල නෙතු පැටලවී
දැහැමි සිත සැලුණේ...

දුරු කළා වූ කෙලෙස්
යකුන් මෙන් නැගිටලා
බුදුන් සේ උන් පළව
හරින්නට නම් බැරි වුණා...

බෝ මළුව මද පවන
නුඹේ සුසුම් හද දවයි
බණ පොතේ පිටු අතර
නුඹෙ රුවින් පව් පිරෙයි...

පෙර වින්ද ආදරය
හද සමඟ හාද වෙයි
ඉකිබිඳින නෙත් කඳුළු
කසාවත තෙත් කරයි...

**එච්.පී. තේජනී නිකේෂලා ගනේවෙල**
**ලොන්ජරි - වතුපිටිවල**

හොඳම නිර්මාණය සඳහා නිර්දේශිතයි



## මිනිස් පවුර

හිරු හිරුමවත් සඳ සඳුමවත්
නොදකිනා මහ විශ්වයේ
නුඹ නුඹමවත් මම මමමවත්
කෙලෙස දකින්නද ළබැඳියේ
එය එසේවත් මුළු ලොවේ නෙත්
අප දෙසම ඇයි බලන්නේ
හිරුත් නොදකින සඳුත් නොදකින
මිනිස් පවුරකි අප වටේ

**ඩී.එස්. කුමුදුනි දිල්රුක්ෂි**
**එසෙන්ෂල්ස්**
**කොග්ගල**

## බත් ගස

මදුලුය සකස් කරගෙන නිසි පරිදි වම
රසබර ආහාරයක් හදලා පිරිය තම
කෑවොත් දෙවේලෙම මතක රසය අම
කිරි එරෙනවා දරු ඇති අම්මලට හැම

කොස් ඇට එකතු කර වැලි කොස් ඇට දමලා
මදුලුය තම්බා වියළා අටු කොස් හදලා
සීනිය පොල් දමා වන්ගෙඩියේ කොටලා
ගම්බද මව්පියන් කති රසවත් කරලා

කොස් ගසකින් තියෙන ඉමහත් වටිනාකම
අපමණ වේය වචනෙන් කළ නොහැක නිම
එහෙයින් ඉඩමේ ඇති හිස් අඟලකම හැම
කොස් පැළ හිටවන්න ඇරයුම් කරමි මම

**විබුද්ධි ප්‍රසාද්**
**ෆිනිෂින් - රත්මලාන**



## සොඳුරු ලියේ

සුදුවන් මීදුම් සළුව ඉරාගෙන
රන්වන් හිරු රැස් පොළව සිඹිද්දි
ජීවිතයේ නව දිනක ඇරඹුමයි
ඔයාගේ ආදරේ සුවඳ දැනෙද්දි

වැටෙන වැටෙන පිණි බිංදුවක ලස්සන
රෝස මලක පෙති හැඩ ගන්වද්දී
නැවුම් පැතුම් මා හද පුරවන්නේ
ඔයාගේ ආදරේ සිතට දැනෙද්දි

නිතරම දිළිසෙන නිල් තරු ඇස් දෙක
හිනාවෙන්න මට පාර කියද්දී
ආදරේ සිතුවම් සිතේ ඇඳෙන්නේ
ඔයාගේ ආදරේ හාදු ගෙනෙද්දි

පෙරුමන් පුරමින් ළඟින් ඉන්නට
සෙනේ සිතින් හදවතට කියද්දි
ආදරයකින් මගේ සිත පිරවෙන්නේ
ඔයාගේ ආදරේ මගේම වෙද්දි

**සිසිර**
**කැෂුවල්වෙයා(ඊ)**
**රිදීගම**

## සීගිරි අප්සරාව

ඇසිපිය සලන මොහොතේ සිසිලස අතරේ
විසිරෙන පැතුම් මැද නුඹ ළඟ සණ අඳුරේ
රිසි සේ නැතත් අභරණ හැඩ ඇති සිරුරේ
කිසිවෙකුටත් නොදෙමි නුඹ ඇත පපු තුරුරේ

අන්දා සිහින් අභරණ නැත සරසන්ට
නින්දා කමක් නැත හැක මට හිනැ හෙන්ට
බිම්බා බිසව් සිරි යහනේ සැත පෙන්ට
වැන්දා නුඹව දකිනට රිසි ඉඩ දෙන්ට

කුට්ටම් පොකුණ ළඟ පිය ගැට පෙළ ළඟදී
වත්කම් නොදුටු මුත් මා දුටු විට මගදී
වත්තම් කරන් බඳ වට රජෙකුගෙ අතදී
සිත්තම් කළේ ඇයි නුඹ මා හට බහදී

මියෙනා සිහින් ළැම ඇඳ කැටපත් පවුරේ
අඹනා සිත්තරා මා අඳිනා අතරේ
හැරුණා යළිත් පෙර මතකෙට මෙන් සසරේ
ඇසුණා ගෙජ්ජි හඬ නැවතත් රජ මැදුරේ

දෑඟිලි පටල ඈ හට සිරි සුව දුන්නා
රූ සිරි විඳ රජුනි නුඹ ඈ ළඟ උන්නා
ආසිරි සෙමර මට නොව ඇයටයි සිතුනා
සීගිරි අප්සරාවක් වෙන්නට හිතුනා

**එස්. එච්. අචින්තා දිල්රුක්ෂි**
**එසෙන්ෂල්ස් - කහවත්ත**

හොඳම නිර්මාණය සඳහා නිර්දේශිතයි

# හදගැස්මේ පෙළගැස්ම

## [කට ගැස්මට නොව තිගැස්මට]



හැමදාම වැස්සට ආදරය කරන බත් කුරාට මෙදා සැරේ නම් වැස්ස ගැන සුන්දර කතා ගොතන්න බැහැ. මොකද වැස්ස නිසා වියරු වෙච්ච ගංගා ඇළ දොළ කරපු විනාශයේ මතක සටහන් තවමත් කාගේවත් හිත්වලින් අයින් වෙලා නැහැ. ඒ තරමටම වැස්ස මෙදා සැරේ හැමෝගෙම ඇස්වලින් කඳුළු ගලන මතක ගොඩාක් අතීතයට ඉතිරි කළා.

ලස්සනට පොසොන් හඳ පායලා තියන රෑ යාමෙක ගිනි කරුවලේ ගමන් කරන කලාමැදිරියෝ රංචුවක් සීත සුළඟ හමන තෙතමනය රැඳුණු පරිසරය තවත් ලස්සන කළා. හරියට අහසේ ඉදන් තරු ගොන්නක් බිමට ඇවිත් වගේ. මේ දිහා බලන් ඉන්න බත් කුරට ලස්සන කතාවක් මතක් වුණා.

එක කාලෙක කැලෑවේ හිටියා රත්තරන් පිහාටු තියන පණු කුරුල්ලෙක්. පණු කුරුල්ලෙක් කිව්වට මෙයා තරම් ලස්සන කුරුල්ලෙක් තවත් හිටියේ නෑ. පණුවන් කෑමට දක්ෂ නිසා තමයි මෙයාට ඒ නම ලැබිලා තිබුණේ. ඉතිං දවසක් මේ පණු කුරුල්ලා කෑම හොයාගෙන යද්දී එක මිනිහෙක් පණුවන් රැගත් කූඩයක් අරගෙන නගරයේ වෙළෙඳපොළට යනවා දැක්කා. ඉතිං මේ අපේ කතානායකයා තමන් කෑම හොයාගෙන යන වැඩේ නතර කරලා මේ පණු කූඩය දිහා බොහෝම ආසාවෙන් බලාගෙන හිටියා.

"හම්ම්ම්ම්... මේ වගේ කෑම ටිකක් නිකං ලැබෙනවා නම් මොකටද මම මහන්සි වෙන්නේ." කියලා හිතලා කෙලින්ම පියාඹාගෙන ගියා අර මනුස්සයා ළඟට. ගිහින් මෙහෙම ඇහුවා. "මේ කොහාටද ඔය පණු කූඩය අරන් යන්නේ?"

ඉතිං අර මනුස්සයා කිව්වා, "මම මේ පොළට යනවා මේ පණුවන් විකුණන්න" කියලා.

අපේ කුරුලු හාමිට හරි සතුටුයි. එච්චර කෑම ගොඩාක් එයා මීට කලින් දැකලා නෑ. ඉතිං පුංචි අදහසක් මේ පණු කුරුල්ලාගේ මොළයට ආවා. එයා මෙහෙම ඒ මිනිහට කිව්වා.

"ඔය පණුවෝ ටික දෙනවා නම් මම මගේ රත්තරන් කුරුලු පිහාටුවක් දෙන්නම් ඔයාට" කියලා.

ඒ මනුස්සයත් බොහෝම කැමති වුණා. මොකද පණුවෝ මල්ල කර ගහගෙන ඇවිදිනවාට වඩා මේ කුරුල්ලාගේ රන් පිහාටුවක් වටින නිසා.

ඔන්න අන්තිමේදී මේ දෙදෙනා බොහොම සන්තෝෂයෙන් තමන්ගේ භාණ්ඩ හුවමාරු කර ගත්තා. රත්තරන් පිහාටුවකට පණුවන් පිරුණු කූඩය හුවමාරු කරගත්ත අපේ කුරුලු යාළුවා බොහෝම සතුටින් එයාගේ කැදැල්ලට පියාඹලා ගියා.

මේ විදිහට දවස් සති මාස ගාණක් රත්තරන් පිහාටුවකට පණු කූඩයක් හුවමාරු කරගන්න අපේ පණු කුරුල්ලාට පුළුවන් උණා. කෑම ටික දැන් නිකම්ම ළඟටම එන නිසා මේ කුරුල්ලා එන්න එන්නම කම්මැලි වුණා.

කාලය ගතවුණේ හරි ඉක්මනින්. අද පණු කුරුල්ලාගේ ඇගේ තියන අන්තිම රන් පිහාටුව දීලා එයා පණු කූඩය ඉල්ල ගත්තා. දැන් හෙට ඉඳලා එයාට කෑම හුවමාරුවට පිහාටු නෑ. මේක දැක්ක අර මනුස්සයත් කුරුල්ලගේ පණු කෑම ගේන එක නැවැත්තුවා.

අනේ අපේ කුරුලුහාමි හුඟාක් අසරණ වුණා. දැන් එයාට කෑම ලැබෙන්නේ නෑ.. කෑම හොයාගෙන යන්න විදිහකුත් නෑ. මොකද නිකම්ම ඉඳලා එයා දැන් හුඟාක් මහතයි, ඒ වගේම කම්මැලියි. වැදගත්ම දේ තමයි දැන් මේ පණු කුරුල්ලාට පියාඹන්න කිසිම පිහාටුවක් නෑ....

ඇත්තටම සිද්ද වුණ කතාවක් නොවුණත් බත් කුරා මේ කතාව ඔයාලට කිව්වේ පුංචි අවවාදයක් දෙන්න.

අපි හැමෝම රත්තරන් පිහාටු තියන පණු කුරුල්ලෝ වගේ..

රත්තරන් පිහාටු කියන්නේ අපිට තියන දක්ෂතා, අපේ හැකියාවන් වගේ දේවල්. අපි ඒවගෙන් වැඩ ගන්න ඕනේ. වැඩ කරන්න ඕනේ. එහෙම නැතිව නිකං ඉඳලා කෑම හොයාගන්න ගියොත් අපිටත් වෙන්නේ අර පණු කුරුල්ලාට වගේ දක්ෂතා, හැකියාවන් නැති වෙන එක විතරයි. එහෙම වුණාම අපි නිකන්ම අවලංගු වෙච්ච අය වෙනවා.

නපුරු වෙච්ච ගං වතුර දැන් සාමාන්‍ය වෙලා. හැම දෙයක්ම නැති වෙච්ච හුඟාක් දෙනා ආපහු මුල ඉඳලාම නැගිටින්න පටන් අරන්. බලාපොරොත්තු, විශ්වාස වගේම අධිෂ්ඨානත් ඒ මුණුවලින් පේනවා..

"ඔව් වරදිනවා තමයි.. නමුත් පරදින්න එපා.. ඔහොම යං ජය වේවා"

බත් කුරා මුළු හදවතින්ම ඒ අයට සුබ පැතුවා..

බත් කුරා



## හීනෙකට පාට දෙන්න

වේළිලා කරවෙච්ච - අතීතෙක ඉපල් මත
රැඳී නොරැඳී හිඳින  - හිම පාට මතක පොත
දැන් ඉතින් අවසරයි - බිඳී විසිරී යන්න

අපේ නොවූ අපෙ මතක - මහ දුරක් කරපින්න
හූර හූරා හිතම - එක ලෙසට දුක් දුන්න
අතීතය මී කුණකි - වලදමමි මේ දැන්ම

සොඳුරු ඔබ සිහින ගෙන - ගොඩ වදින සුළං රොද
අහුරාවි මග ඉඳන් - අතීතෙක කඳුළු කැට
මොහොතකටවත් නැවතී - එපා මග පැකිලෙන්න

ඉරී තැළුණු හද කතර - අලුත් මල් පුදද්දී
හිතේ මැද්දෙම නොයිඳ - හුඟක් ඈතට වෙලා
සෙනෙහසේ අනෝරාවට - එන්න ඉඩ දෙන්න

**මේනු**
**කැෂුවල්වෙයා(ඊ)**
**රිදීගම**





## සිහින කුමරා

දුරක ඉඳන් ඇවිදින් ඔබ
මගේ සිතේ පාළු මකා
එළිය කළා මගෙ ලෝකෙම
සතුටු සිතින් සිනා සලා

මගෙ ලෝකේ සොඳුරු සිහිනේ
හිමිකාරයා ඔබයි සදා
එක්වී අප යන මේ මග
එළිය වේවා මතු දිනයක

කරදර බාධා ආවත්
බිය නෑ මට ඔබ ඇත්නම්
ජය පැරදුම එක ලෙස සිත
සරු කරගමු යුග දිවියම

**සුමුදු**
**ෆාස්ට් ෆැෂන් - මිනුවන්ගොඩ**

## දෙවෙන්දොරාසන්ට

විඩාබර නෙත් අගට
පාට සායම් මවන
කබුකි රැඟුමෙන් පැයෙක
මැවෙන්නේ ඔබේ රුව...

හිරි වැටුණු දෙසවනට
මෘදු ස්වර තවරනා
තත්සරේ තාලයක
ඇසෙන්නේ ඔබේ හඬ...

සවි නොලත් හදවතට
හදවතින් ළංවී
අහිංසක පැතුමක්ව
පීදෙන්න ඔබේ පෙම...

**ලිහිනි අප්සරා**
**එසෙන්ෂල්ස් - කොග්ගල**



## ඇයයි ලොව දිනන්නී

හෙලා සුරතල් සිනා -  ළපටි බස් දොඩන්නී
පුංචි දෝණිය ලෙසින් - නිවස එළි කරන්නී
වැඩි කීකරු කමින් - දෙගුරු සිත් රකින්නී
සිනා කෙළි කවට මැද - සිප් සයුර ලබන්නී
යොවුන් හසරැළි මැදින් - සෙනෙහෙදම් විදින්නී
මා පියන් අසිරි මැද - කුල ගෙයට පා තබන්නී
නොබිඳ කුල ගෙයි සිරිත් - සුරලොවක් තනන්නී
දිවිපුදා පතිවතට - හිමිසඳුන් රකින්නී
උහුලමින් දුක් සුසුම් - දරු ගැබක් දරන්නී
දහසකුත් සිහින වැල් - හදවතින් පුරන්නී
ගුණ නුවණ හෙබි පුතුන් - ලොවට හිමි කරන්නී
හෙට ලොවක් තනන්නට - තුන්කල්ම දකින්නී
නිසල මහා මෙර තරම් - දුක් සුසුම් දරන්නී
කඳුළු වැල් සඟවලා - සිනා කැන් ඉසින්නී
දියණියක, සිසුවියක, පතිනියක, මවක වී
ලොවට ප්‍රාණය දෙවන - ඇයයි ලොව දිනන්නී...

**චමිලා ප්‍රියංගනී කරුණාරත්න**
**එසෙන්ෂල්ස්**
**රඹුක්කන**

# කුරුල්ලන්ගේ ස්වර්ගයේ සිට ලියමි



ඒ මුල්ම දවසය. බැරිම තැන මම බයිබලය පෙරලීමි. බණ පොත් දෙක තුනක්ද පෙරලා බැලීමි. කුරාණයක් තිබුණේ නැත. ඒත් කිසිවකින් තේරුමක් නැතිය. සැබැවින්ම මා මට ඒත්තු ගන්වන්නට ගියේ ඉවසීමෙහි වටිනාකමය. දරා ගැනීමය. අඩුම ගණනේ ඔහු ගිය මුල්ම දවසේවත් මට එය තිබිය යුතු වන්නේ නොවේද... ඔහු ගියේ යළි එන්නටය... ඒත් මට ඒ කිසිවකින් වැඩක් නොවීය. ඉතින් මම මටම පරාජය වුණෙමි. මට ඔහු නොබලා ඉන්නටම බැරි විය.

අවසනදී මම නිල් සුරඟනව මුණගැසෙන්නට ගියෙමි. මගේ එකම ඉල්ලීම වූයේ මාව ශක්තිමත් තටු ඇති කිරිල්ලියක් කරන්නටය. ප්‍රශ්නාවලි කිහිපයකින් පසු ඇයද මා දෙස දුක්බර බැල්මක් හෙලුවාය. ඉතින් මා කිරිල්ලක වූයේ එසේය.

මගේ පියාපත් තැවෙන්නට වූයේ ඔහු ඉන්නා ඉසව්ව නොදන්නා නිසාය. නමුත් මට යන්නට ඕනෑ විය. ඔහු කියනා පරිදිම මම දුර දිග නොසිතා තීරණ ගන්නා කෙනෙකි. කිරිල්ලියක වූ පලියට ඒ ගුණය වෙනස් වූයේ නැත. ඉතින් මම පියඹා ගියෙමි.

මා ඔහු ගැන දැන වුන්නේ එකම එක දෙයකි. ඒ ඔහු චෙස්නට් පැහැ ඇස් ඇත්තෙකු බවට පමණකි. මම මග හමුවන බොහෝ කුරුල්ලන්ගෙන් එවැනි ඇස් ඇති අය ගැන ඇසීමි. ඔවුන් කිසිවෙකු මට තරවටු කළේ නැත. ඔවුන් දන්නා පරිදි මට මග කිව්වෝය. මා දෙස අසරණව බැලූහ. ඒ ඇයි දැයි මා දන්නේ නැත.

ඉතින් ඔවුන් කියූ පරිදි පාසල් හැරෙන වෙලාවට ගේට්ටු කණුවල වසා සිටියෙමි. ඉරිදා දිව්‍ය පූජා හැරෙන වෙලාවට පල්ලිය මුදුනේ සුර දූත සුරුවම්වල වසා උන්නෙමි. දුම්රිය ස්ථානවලට ඉහළින් එහා මෙහා පියඹා ගියෙමි. නමුත් චෙස්නට් ඇස් ලක්ෂ ගණනක් අතර මට ඔහු මුණගැසුනේ නැත.

මා මෙහි පැමිණෙද්දී වසන්තයේ මුල් භාගයය. කලෙක කොළ හැලී ගියේය. දැන් එය සීත කාලය වී ඇත. වෙහෙස නිවා ගන්නට ඉපල් වූ ගස්වල සීතලේ මම වසා උන්නෙමි. මම පරවියන්ට මගේ දුක කීවෙමි. කිසිවෙකින් පලක් නොවීය. සීතල දරන්නම බැරි දිනවල මම ගරා වැටුණු ගොඩනැගිලි තුළ ලැග්ගෙමි.

ශරීර ශක්තිය තවත් ඉතිරිව තිබුණා යැයි නොකියමි. පණ කෙන්ද රැකී තිබුණේ බලාපොරොත්තුව නැමැති රැහැනෙනි.

ඉතින්... එකම දිනක හදිසියේ ඔහු මගේ නෙත ගැටිණ. මම වසා සිටියේ ඔහුගේ නිවස ඉදිරිපස නම නොදන්නා ගසකය. එහි කිසිම කිසි කොළයක් නොවීය. සුදු පැහැ හිමවලින් එය නැහැවී තිබිණ. කිසිදු ශබ්දයක් නගන්නට නොහැකි පරිදි මගේ මුව ගල්වී තිබිණ. ඔහු මා දෙසම බලාගෙන සිටින්නට විය. මෙවන් කාලයක කේඩෑරි කිරිල්ලක ගසේ වසා සිටීමේ දුර්ලභ දර්ශනය පෙන්වන්නට ඔහු නිවස තුළ වූ අන් අයට කතා කළේය. මම ඔහු දෙසම බලා සිටියෙමි. මම නොසෙල්වී ඒ සියල්ලෝම දෙස බලා වුණෙමි. ඔහුත් මා දෙසම බලාසිටියේ මා කවදත් ආශා කළ චෙස්නට් දෑස කුඩා කරගෙනය.

**මෙවන් කාලයක කේඩෑරි කිරිල්ලක ගසේ වසා සිටීමේ දුර්ලභ දර්ශනය පෙන්වන්නට ඔහු නිවස තුළ වූ අන් අයට කතා කළේය. මම ඔහු දෙසම බලා සිටියෙමි.**

කලුවර වැටෙන්නට විය. මම හුන් තැනමය. විදුලි බුබුලක් දැල්වුණ කුටියේ වැසුණ කවුළුවෙන් ඔහුගේ බොඳ වුණ සෙවණැල්ල මට පෙනෙන්නට විය. මම ඉතිරි වූ හුස්මක් ඉහළට ගෙන පියඹා ගොස් ජනේල කණ්ඩිය මත වැසුවෙමි. මට දැන් වඩා ළඟින් ඔහුගේ සෙවණැල්ල පෙනේ. ඔහු සිටින්නේ කවුළුව අසලම වන්නට ඇත. මගේ තටු ගල් ගැසී යන්නට විය. ඔහුව ළඟට දුටු විට වෙනදාට වේගයෙන් ගැහෙන හදවත වේගය බාල කරන්නට විය. මම සෙමින් ජනෙල් වීදුරුව දෙසට පහත් වී යන්තම් බොඳවී පෙනෙන ඒ සෙවණැල්ල ආදරයෙන් සිපගතිමි. මට මතක ඉන්පසු ගෙවුණ මිනිත්තුව පිළිබඳව පමණය. ඒ සීතල දරන්නට මට නොහැකි වන්නට ඇත. ඒ මුළු මිනිත්තුවටම මගේ හදවත තුන් වතාවක් ගැහී නතර විය...

ඉන්පසු උදෑසන මා සිටියේ පෙර වසා වුන් ගස මතය. ගල් ගැසී ප්‍රාණය නිරුද්ධ වූ අවලස්සන වූ කිරිල්ලකගේ සිරුර පමණක් ජනේල පඩිය මත රැඳී තිබිණ.

තව දුරටත් මට සීතලක් නැත. මම ගස මත සිට මා දෙසම බලා සිටියෙමි. හදවත නවතින්නට පෙර මගේ අවසාන සිතුවිල්ල මට සැබැවින්ම මතක නැත. නමුත් මා සතුටින් සිටි බව පමණක්ම මතකය.

මහා කලබලයකි. ඔහු දිව විත් දුරින් සිට මිය ගිය කිරිල්ල දෙස බලා සිටියේය. ඉන්පසු ගස දෙස බැලුවේය. මා එහි සිටිනා බව ඔහුට නොපෙනෙන්නට ඇත. අවසනදී සෙමින් ළංවී ඔහු මිය ගිය කිරිල්ල දෝතින්ම ගත්තේය. එහි පණ රැඳී ඇත්දැයි ඔහු පිරික්සන්නට ඇත. කිසිවක්ම නොවූ කල්හී ඔහු කිරිල්ල පපුවට තුරුලු කරගෙන මට පිටුපා ගේ පිටුපසට පිය නගන්නට විය. එවේලෙහි නම් මා ඒ කිරිල්ලගේ සිරුරේ ජීවත්ව සිටියා නම් යැයි සිතුවිල්ල මා දැඩි ලෙස පෙලන්නට විය. මා ඉගිළී ඒ දෙසට ගියෙමි.

මා ඔහුගේ දෑතින්ම මිහිදන් වන අයුරු මම ඔහේ බලා සිටියෙමි...

**නුවන්තිකා ප්‍රනාන්දු**
**සෙන්ටර් ඔෆ් ඉන්ස්පිරේෂන්ස් - ඒකල**

හොඳම නිර්මාණය සඳහා නිර්දේශිතයි



# පාර මතකනම් තාමත් ගේ ළඟයි දුවේ

රත්න ශ්‍රී, රෝහණ, සුනිල් යන තුන් කට්ටුව විසින් සිංහල ගීත සාහිත්‍යයට කරලා තියන මෙහෙය නම් අපරිමිතයි. සමාජ යතාර්ථයන් නාද සිත්තම්වලට මුහුකරලා ලයාන්විතව අපේ හිත් ඇතුළට කාවද්දන්න ඔවුන්ගේ නිර්මාණවලට පුළුවන්. ඉතින් අද මම කියන්න යන්නේ මේ ගීත ලොකයේ යෝධයන් තිදෙනා අතින් නිමවුන අතිශයින්ම හැඟුම්බර ගීයක් පිළිබඳව.

පිය සෙනෙහස කියන්නේ හරි අපූරු ආදරයක්. හැම තාත්තා කෙනෙක්ම තමන්ගේ ආදරය දරුවන්ට එළිපිටම පෙන්වන්නේ කලාතුරකින්. නමුත් දියණියක් ඉන්න තාත්තා කෙනෙකුට නම් එහෙම නොකර ඉන්න බෑ. පුංචි දියණියන්ගේ ආදර, සුරතල්, බොළඳ වදන්වලින් ගල් වගේ හිත් තියන තාත්තලා මෑදු මොලොක් වෙන එක සාමාන්‍යයි. ඒ එක්කම ඒ තාත්තා තමන්ගේ දුවගේ හොඳම ආරක්ෂකයා, විශ්වාසවන්තයා වෙනවා. දුවෙක් සහ තාත්තා කෙනෙක් විතරක් ඉන්න ගෙදරක ඇයත් ඔහුව දමා ගියොත් මොකද වෙන්නේ. මොකක්ද ඒ තාත්තාට හිතෙන්නේ...

*චන්ද්‍ර මණ්ඩලේ සැතපුන පුංචි සාවියේ*
*මන්ද කියාපන් නොකියා හැංගිලා ගියේ*
*පාන නිවුන සේ පාළුයි ලැයින් කාමරේ*
*මන්ද නුඹ ගියේ කියපං පුංචි සාවියේ*

පුංචි කාලේ අපි ඇහුවේ හඳේ හාවෙක් ඉන්න බවයි. නමුත් අපි කවුරුවත් ඒ හඳේ හාවා සාවියක් එහෙම නැත්නම් ගැහැණු සතෙක් බවට පත් කරලා නෑ. මේ ගීතයේ ගේය පද රචකයා වන රත්න ශ්‍රී මහතාගේ දක්ෂතාවය අන්න ඒකයි. ඔහු මේ ගීයේ මුලින්ම මේ තාත්තාගේ හිතේ තියන ආදරය ඒ විදිහට කියනවා. හාවෙක් කියන්නේ බොහෝම අහිංසක, ලස්සන සතෙක්. ඔහු තමන්ගේ දුවව දකින්නෙත් ඒ විදිහට ඇය ඉතාම පියකරුයි, අහිංසකයි. නමුත් දැන් ඈ හැංගිලා ගිහින්. එතැනදි මගේ හිතට එන්නේ ඇය මේ තාත්තාට නොකියාම ගෙදරින් ගිය බවයි. පාන නිවුන සේ පාලුයි ලැයින් කාමරේ යන්නෙන් අදහස් කරන්නේ ඔවුන්ගේ සමාජ තත්ත්වය. ලැයින් කාමරය කියන්නේ දුප්පත් ජනයා වාසය කරන එකට බැඳුණු නිවාස පේළියකට. ඉතා කුඩා වපසරියක් ඇති නිසා මේවාට කියන්නේ කාමර ලෙසයි විදුලි එළියවත් නොමැති මේ නිවහන ඇතුළේ දරිද්‍රතාවය පිරිලා ඉතිරිලා යනවා. ඒ නිවසේ එළිය ගෙනදුන් එකම පහන වූ තමන්ගේ දුව ගිය පසු මුළු ගෙදරම අඳුරුවූ බව මේ පියා පවසනවා.

*ලාබ රත්තරන් දිලිසෙන පාළු වීදියේ*
*ගෑණු ළමයි පියාඹලා ඉස්සරත් ගියේ*
*උන්ට සෙයිලමේ මගතොට පාර වැරදුනේ*
*අන්න ඒ නිසයි මට දුක රත්තරන් දුවේ*

මේ ගීතයේ මම ආසම කොටස තමයි මුල්ම පද පේළිය. රත්තරන් කොහොමද ලාබ වෙන්නේ? වීදියක් කොහොමද පාළු වෙන්නේ? ඒ කියන්නේ දිලිසෙන සියල්ල රත්තරන් නෙමෙයි කියලා මේ තාත්තා දන්නවා. ඒ රත්තරන්වල වටිනාකමක් නෑ. සමහරවිට ඒ රත්තරන් රැවටීම සඳහා පාවිච්චි කරන ඒවා බව ඔහුට හැගෙනවා. පාළු වීදිය කිව්වේ ජන ශූන්‍ය කියන එක නෙමෙයි. එහි ඇති ගුප්ත බව හඟවන්න. මේවාට රැවටුන ගමේ තවත් ගැහැණු ළමයින් නගරයට ගිහින් පාර වරද්ද ගත්තා. එහෙම නැත්නම් ජීවිතය වරද්ද ගත්තා. ඒ අතීතය දන්න නිසා මේ තාත්තා කියනවා අන්න ඒ නිසා මට දුව ගැන බයයි, ඔයා පරිස්සම් වෙන්න කියලා.

*මාල බැඳන් සුදුයකඩෙන් රෝස මල් වනේ*
*මාල ගිරව් ගේ දොරකඩ සිංදු කිව් වෙලේ*
*හීනේනුත් හිතුනේ නෑ මට මොකද කාරනේ*
*පාර මතකනම් තාමත් ගේ ළඟයි දුවේ*

සුදුයකඩ මාල දමාගෙන ගෙදර දොරකඩට ඇවිත් ව්‍යාජ ආදරයක් මවාපාමින් දුවව රවටා ගන්න උත්සහ ගත්ත රස්තියාදු තරුණයන් ගැන මේ පියා හඳුන්වන්නේ රෝස මල් අරගෙන ආව මාල ගිරව් විදිහට. ඔහු හීනෙන් නොහිතපු විදිහට තමාගේ විශ්වාසය බිඳ දමපු මේ දියණිය අර තරුණයෙක් සමඟ නොකියාම ගෙදරින් යනවා. දෝරේ ගලායන නොනිමි සෙනෙහසත් එක්ක මේ තාත්තා දුවට ආපහු ගෙදර එන්න කියලා කියන්නේ, පාර මතක නම් තාමත් ගේ ළඟයි, කියලා.

අද සමාජයේ බහුලවම තියන ඛේදවාචකයක් තමයි රත්න ශ්‍රී මේ විදිහට ගීතයකින් සමාජගත කරන්නේ. ආදරණීය පියෙකුගේ හිතේ ඇතිවන දුක, ශෝකය සියුම් ස්වර මතින් ගෙන එන්නට රෝහණ වීරසිංහයන් සමත් වෙනවා. සුනිල් එදිරිසිංහ මහතාගේ ලයාන්විත හඬ මේ පියාගේ සංවේදී විලාපය හිත කීරි ගස්සනවා. දුවෙක් ඉන්න තාත්තලා හැමෝම වගේම හැම දුවෙක්ම මේ ලයාන්විතව කියවෙන බැරෑරුම්කම තේරුම් ගත යුතුයි.

ඔබ මේ ලිපිය කියවන මොහොතෙත් මෙවැනි සුවහසක් දූවරුන් මාල ගිරවුන්ගේ කතාවලට රැවටිලා යනවා ඇති. ඒ නිසා ඔවුන්ගේ පියවරුන්ටත් මේ වගේම හිතෙනවා ඇති.

*පාන නිවුන සේ පාලුයි ලැයිම් කාමරේ*
*මන්ද නුඹ ගියේ කියපන් පුංචි සාවියේ*

ඉතින්, හිතන්න ඔබට භාරයි.

**මොහාන් සුරවීර**




# ලියන් සවිබලගන්වන P.A.C.E. ක්‍රියාශීලී ගමනක



ෆාස්ට් ෆැෂන් 1, මීරිගම



එසෙන්ෂල්ස්, කොග්ගල



එසෙන්ෂල්ස්, රඹුක්කන



ෆාස්ට් ෆැෂන්, මිනුවන්ගොඩ




ෆාස්ට් ෆැෂන් 2, මීරිගම

## දිනන ඇය...

සාමාජිකාවන් 41 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක නායකත්වය දෙන ඇය 2017 වසරේ ජනවාරි මස P.A.C.E. වැඩසටහනට සම්බන්ධවීමත් සමඟින් සුවිශේෂී ප්‍රගතියක් පෙන්නුම් කිරීමට සමත්වූයාය.

ආයතන කළමණාකාරීත්වයට අනුව ඇය සිය කණ්ඩායම කළමනාකරණය කරමින් කණ්ඩායමේ සාර්ථකත්වය උදෙසා බොහෝසෙයින් දායකවී තිබේ. ඇයගේ අරමුණ වන්නේ සෑම මසකම කණ්ඩායම වෙත පිරිනැමෙන ප්‍රසාද දීමනාව සිය කණ්ඩායම වෙත ලබාගැනීමය. ඒ සඳහා ඇය සිය කණ්ඩායමේ එක් එක් සාමාජිකාවන්ගේ පුද්ගලික මට්ටම් තේරුම් ගනිමින් සහ සෞඛ්‍යය තත්ත්වය සමබරව පවත්වා ගැනීම මගින් නොපැමිණීම් සහ සේවය හැරයාම් අවම කිරීමට සමත්වී තිබේ. සිය කණ්ඩායම වැඩි ධනාත්මක ශක්තියකින් යුතුව කටයුතු කිරීමට මෙහෙයවමින් එම කණ්ඩායම වෙතින් මින් පෙර නොවූ කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කිරීමට ඇය සමත්වී තිබේ. ඇයගේ මේ සියලු ධනාත්මක වර්ධනයන්ගේ සහ ක්‍රියාකාරකම්වලට හේතුව වී ඇත්තේ PACE වැඩසටහන බව දන්වන්නේ සතුට පිරි ආඩම්බරයකිනි.



නම : **නිලන්ති**
ආයතනය : **ෆාස්ට් ෆැෂන් 2, මීරිගම**
සම්බන්ධ වූ දිනය : **2011.07.11**

# කලබල නගරයේ නිසල සුන්දරත්වය










කොළඹ නගරය කියන්නේ රටේ ආර්ථිකයේ හදවත වගේ තැනක්. මේ වගේ නගරයක රැයක් දවාලක් නැතිව එහේ මෙහේ දුවන මිනිස්සුන්ගේ ජීවිතවල හදගැස්මත් මේ ජීවන රටාවට අනුවම වේගවත් වෙලා. එච්චරම කාර්යබහුල නගරයක, සැනසිල්ලේ හුස්ම පොදක් ගන්න තියෙන තැන් හරිම අඩුයි. හැමදාම වියමන් ගමන්වලින් දුර ඈත සුන්දරත්වය හොයාගෙන ගිය අපි, අද යන්න ලෑස්තිවෙන්නේ නගරබද තියෙන සැඟවුණු නිස්කලංක තැනකට.

බැද්දගාන තෙත් කලාපය නැත්නම් බැද්දගාන තෙත් කලාප උද්‍යානය කියන්නේ නගරයට බොහොම සමීප, නමුත් ගොඩාක් දෙනෙක්ගේ අවධානයට අසු නොවුණු තැනක්. මෑත කාලයේදී නවීකරණය කෙරුණු මේ ස්ථානයට



ළඟා වෙන්න මාර්ග කිහිපයක්ම තියෙනවා. මම තෝරා ගත්තේ රාජගිරිය දියත උයන අසලින් තියෙන මාර්ගය.

මෙතැනට යන්න සුදුසුම කාලය තමයි හිමිදිරි උදෑසන සහ ඉර බැහැගෙන යන සැන්දෑ කාලය. සොබාව සෞන්දර්යය විඳින්න, සතුන් අධ්‍යයනය කරන්න වගේම නිදහසේ කාලය ගත කරන්නත් හොඳටම පුළුවන් වෙන්නේ ඒ වේලාවල්වලට ගියොත්. උද්‍යානයට ඇතුළු වෙද්දී සුළු මුදකට අවසර පත්‍රයක් ගන්න වෙනවා ඇතුළුවන තැන තියෙන කාර්යාලයෙන්. උද්‍යානයට පිවිසුණ තැන ඉඳන්ම තියෙන්නේ බොහෝම තෙත් පරිසරයක්. ඇවිදින්න බොරළු පාරක් අහුවෙනකම් යන්න තියෙන්නේ ඒ තෙත් බිමට උඩින් සාදා තියෙන ලී පාලම්වලින්.

බැද්දගාන තෙත් බිම ගොඩාක් වෙලාවට කුරුල්ලන් අධ්‍යයනය කරන අය වගේම උභය ජීවීන් අධ්‍යයනය කරන අයගේත් අවධානය දිනූ ස්ථානයක්. අපි මේ තැනට යනකොට පරිසරයේ වගේම ඒ අධ්‍යයන කටයුතු කරන අයගේත් අවධානයට බාධා නොවෙන විදිහට හැසිරෙන්න වග බලා ගන්න එක සිහියේ තියාගන්න අවශ්‍යයි.

ඉර බහින වෙලාවට මේ ස්ථානය හරිම ලස්සනයි. තැනින් තැන හදලා තියෙන නැරඹුම් ස්ථානවලට ගියොත් හොඳින්ම මේ ලස්සන දැක බලා ගන්න පුළුවන්. මේ ලස්සන නිසාමයි මංගල ඡායාරූප සඳහාත් මෙතැන යොදා ගැනෙන්නේ. ඔබත් කොළඹ නගරය ආසන්නයේ ඉන්න කෙනෙක් නම්, නිස්කලංක වේලාවක පරිසරයත් එක්ක මොහොතක් ගත කරන්න කැමති නම්, මම යෝජනා කරනවා මෙතැනට ඇවිත් යන්න කියලා. අපි නැවතත් අලුත්ම වියමන් ගමනකින් හමු වෙමු.

**හෂාන් ගුණසේකර**

## Be Positive




# කාට්වේ ගමේ රැජිණ

ජීවිතේ කියන්නේ ක්‍රීඩාවක්. අපි ගන්න හැම තීරණයකින්ම, හැම අවස්ථාවකින්ම අපේ ක්‍රීඩාවේ අවසානය තීරණය වෙනවා. ජීවිතේ පටන් ගත්ත තැනට වඩා අපි ජීවිතේ අවසාන කරන තැන තීරණය කරන්නේ මෙන්න මේ ක්‍රීඩාව නිසායි. ජීවිතේ තුළින් ක්‍රීඩාව ජයගත් කෙනෙක් වටා ගෙතුණු චිත්‍රපටියක් ගැන තමයි අපි අද කතා කරන්න යන්නේ.

අපේ කතා නායිකාව වෙන ෆියෝනා ඉන්නේ උගන්ඩාව කියන රටේ කාට්වේ ගම්මානයේ අන්ත දුප්පත් සමාජ පන්තියක. ඇගේ පියා මිය ගිහින්. ඇගේ මව එළවළු වෙළෙන්දියක්. පවුලේ දෙවන දියණිය වෙන ෆියෝනාගේ වැඩිමහල් සොහොයුරිය සෙල්ලක්කාර තරුණයෙක් සමඟ ආශ්‍රය නිසා පවුලෙන් එළවා දමනවා. පවුලේ පැවැත්මට මවට උපකාර වන්න ඉන්නේ ෆියෝනාත් ඇගේ සොහොයුරාත් පමණයි. පවුලේ අවසාන දරුවා තවමත් අත දරුවෙක්. අන්ත දිළිඳු රටක් වන උගන්ඩාවේ පාසල් අධ්‍යාපනය ඉහළ පන්තියේ දරුවන්ට පමණක් සීමා වුණු එකක්. ෆියෝනා වැනි වීදියේ ජීවත් වන දරුවන් කුඩා කල සිටම විවිධ දේවල්වලට යොමු වෙනවා පවුලේ පැවැත්ම ගෙනියන්න. බොහෝමයක් වෙලාවට මේවා නරක ආදායම් ඉපැයීමේ මාර්ග. මේ වගේ පරිසරයක තමයි ෆියෝනා ජීවත් වෙන්නේ.

ඇයගේ ගමේ පාසලේ උගන්වන ගුරුවරියකගේ ස්වාමියා ඉංජිනේරුවෙක්. එහෙත් ඔහුට රටේ රැකියා ප්‍රශ්නය නිසා තවම ස්ථිර රැකියාවක් නැහැ. මේ අතර තමයි ඔහු යොමු වෙන්නේ ගමේ දරුවන්ට ෆුට්බෝල් උගන්වන්න. මෙහිදී ඔහුට හමුවනවා ෆියෝනාගේ සොහොයුරාව. ඔහු ෆුට්බෝල් ක්‍රීඩාවට අකමැති කෙනෙක්. ක්‍රීඩාවේ ඇති වන අනතුරුවලට බෙහෙත් ගන්න තමන්ට හැකියාවක් නැති නිසායි ඔහු ක්‍රීඩා නොකරන්නේ. ඒ හේතුව නිසා මේ ගුරුවරයා ඔහු සහ අනෙක් ළමයි කිහිපදෙනෙකුට චෙස් ක්‍රීඩාව හඳුන්වා දෙනවා. චෙස් පන්තියට පැමිණෙන අයට ආහාර ලබා දීමට තරම් මේ ගුරුතුමා කාරුණික වෙනවා. තම සොහොයුරා පසුපස ආ ෆියෝනා මේ පන්තිය ගැන දැන ගන්නා අතර ඇයටත් මේ පන්තියට පැමිණෙන ලෙස ගුරුතුමා ආරාධනා කරන්නේ මේ අවස්ථාවේදියි. ආහාර ලබා දෙන නිසා කුසගින්නේ සිටින ෆියෝනා මේ පන්තියට එන්න එකඟ වෙනවා.

මුලදී ඇය කිසිදු දක්ෂතාවක් නොපෙන්නුවත් ගුරුවරයාගේ මග පෙන්වීම සහ තමන්ගේ කැපවීම නිසා ඇය ඉතා ඉක්මනින් ක්‍රීඩාවේ දක්ෂයෙකු වනවා. පවුල් ප්‍රශ්න මැද ජීවත් වන ළමයින් සහ ආර්ථික ප්‍රශ්න මැද ජීවත් වන ගුරුතුමා එක්ව ගමේ බිහිකරන මේ කුඩා චෙස් කණ්ඩායම මුළු උගන්ඩාවේම දක්ෂතම චෙස් කණ්ඩායම වන බව එදා ඔවුන් දැන නොසිටින්නට ඇති. ඉහළ පන්තියේ සිසුන් අභිභවමින්, අප්‍රිකාවේ අනෙක් රටවල්වල ක්‍රීඩක ක්‍රීඩිකාවන් පරදවමින් ඉදිරියටම යන ෆියෝනා ඇතුළු කණ්ඩායම අවසානයේදී පාසල් අධ්‍යාපනය සහ තමන්ගේ දුක් විඳි ජීවිතත් යහමගකට ගැනීමට සමත් වෙනවා. කිසිවෙකු තමන් ගැන විශ්වාස නොකරත්, කුමන බාධා ජීවිතයට ආවත්, තමන් අවට තමන් ගැන විශ්වාස කරන සහ තමන්ව ධෛර්යයමත් කරන පිරිස් සිටින තාක් කල් ජීවිතය කියන ක්‍රීඩාව පරාජය නොවන බව අපිට කියාදෙන මේ චිත්‍රපටිය ඉතාමත් සුන්දරව දිගහැරෙන චිත්‍රපටියක්. ඔබටත් මෙය රසවිඳින්නට මම ආරාධනා කරනවා.

**හෂාන් ගුණසේකර**

# මෙත් සිසිල ගලායයි

වෙසක් සඳ මෙන්ම පොසොන් සඳ බැස ගියත් ඒ උදෙසා අප ආයතන පරිශ්‍රයන් හි සංවිධාන කරන්නට යෙදුණු වෙසක් පොසොන් සැමරුම්වල මතකයන් නම් සදාකාලයටම රැඳේවි. වෙසක් සහ පොසොන් පොහොය මූලික කරගනිමින් අප ආයතයන් විවිධාකාරයේ පින්කම් සංවිධානය කර තිබුණු අතර කැමරා කාචයේ සටහන් වුණු එවන් සොඳුරු සැමරුම් කිහිපයක සේයාවන් වියමන් මගින් ඔබ වෙත ගෙන එන්න අපි හිතුවා.



ඒකල සෙන්ටර් ඔෆ් ඉන්ස්පිරේෂන්ස් ආයතනයේ පැවති ධර්මදේශනාව සඳහා ස්වාමීන්වහන්සේ වැඩමකළ මොහොත



පන්නල ටෙක්ස්ටයිල් ආයතනය අලංකාරවත් කළ සුන්දර වෙසක් සැරසිල්ලක්



වෙසක් පොහොය නිමිත්තෙන් පොළොන්නරුව ඇත්ලෙෂර් ආයතනයේ පැවති සත් බුදු වන්දනා වැඩසටහනේ එක් අවස්ථාවක්



රඹුක්කන එසෙන්ෂල්ස් ආයතනයේ පැවති කූඩු තරගය සඳහා ඉදිරිපත් කළ නිර්මාණයක්



මිනුවන්ගොඩ ෆාස්ට් ෆැෂන් ආයතනයේ පැවති කඩල දන්සල



කොග්ගල එසෙන්ෂල්ස් ආයතනයේ පැවති කූඩු තරගය සඳහා ඉදිරිපත් කළ නිර්මාණාත්මක කූඩුවක්



මීරිගම ෆාස්ට් ෆැෂන් 1 ආයනගේ පැවති වෙසක් ධර්මදේශනාවට සහභාගීවූ සාමාජිකයින්



මීරිගම ෆාස්ට් ෆැෂන් 2 ආයතන සාමාජිකයින්ගේ ෆලූඩා දන්සල



වෙසක් පොහොය නිමිත්තෙන් සීදුව හරිත කර්මාන්තශාලාවෙහි පැවති ධර්මදේශනාව අතරතුර



පොසොන් පොහොය වෙනුවෙන් රිදීගම කැෂුවල්වෙයා(ර්) ආයතනයේ පැවති ධර්ම දේශනාවට ස්වාමීන්වහන්සේලා වැඩම කරමින්



වැලිසර ෆාස්ට් ෆැෂන් ආයතයේ වෙසක් පොහොය වෙනුවෙන් පැවති වැඩසටහන් මාලාවේ එක් අවස්ථාවක්



රඹුක්කන එසෙන්ෂල්ස් පියසේ පැවති බඩ ඉරිඟු දන්සල



වතුපිටිවල ලොන්ජරි ආයතනයේ පැවති කූඩු තරගය සඳහා ඉදිරිපත් කර තිබූ ස්වභාවික අමුද්‍රව්‍යයන්ගෙන් කළ නිර්මාණයක්



නිවිතිගල එසෙන්ෂල්ස් ආයතනයේ පැවති කූඩු තරගයේ විනිශ්චය කටයුතු අතරතුර



රත්මලාන ෆිනිෂින් ආයතනයේ ගලා ගිය බැති ගී සරණිය



හරිත සලකුණ - පරිසර හිතකාමී බවට FSC මගින් සහතික කරන ලද කඩදාසි හා එළවළු තෙල්වලින් යුත් තීන්ත භාවිතයෙන් මුද්‍රිතයි.